# කොළඹ සහ උපනාගරික ප්‍රදේශ ආශ්‍රිත ගොඩනැගිලි ඉදිකිරීමේ සේවා ස්ථානවල සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය පිළිබඳ අධ්‍යයනය

**භද්‍රානි සේනානායක**

**වසන්ත ප්‍රදීප් කුමාර**

**සහාය පර්යේෂණ කණ්ඩායම**

සුපුන් සේනානායක

සජීව අතාවුද

නිලුක්ෂි තිසේරා

නිලානි රේණුකා

මහේෂි පෙරේරා

**පර්යේෂණ අංශය**

**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය**

**ආරක්ෂක අමාත්‍යාංශය**

# සංක්ෂිප්තය

ලොව බොහෝ රටවල මෙන්ම ලාංකික සමාජය තුළ ද මත්ද්‍රව්‍ය භාවිතය සමාජ ප්‍රශ්නයක් ලෙස හඳුනාගත හැකිය. මත්ද්‍රව්‍ය භාවිතය හේතුකොට ගනිමින් ඒ වටා අතුරු ප්‍රශ්න නිර්මාණය වීමත් සමඟ එයින් ඍජු හා වක්‍ර ආකාරයට සමාජයට වන බලපෑම සුළු කොට සැලකිය නොහැක.

කලින් කලට, ප්‍රදේශයෙන් ප්‍රදේශයට සහ විවිධ සමාජ ස්ථර අනුව ද මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා හා රටා විවිධ වේ. වර්තමාන ශ්‍රී ලාංකේය සමාජයේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සලකා බැලීමේ දී කම්කරු ක්ෂේත්‍රයෙහි සේවයෙහි නියුතු පුද්ගලයින් අතර ද මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ ප්‍රවණතාවක් හඳුනාගත හැකි වේ. කම්කරුවන් සමාජයේ විවිධ ක්ෂේත්‍ර තුළ සේවය කරනු ලබන අතර ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය එයින් එක් ක්ෂේත්‍රයක් වේ. මෑතකාලීනව වාර්තා වන තොරතුරු අනුව ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නියුතු කම්කරුවන් නීත්‍යානුකූල මද්‍යසාර, නීති විරෝධී මත්ද්‍රව්‍ය සහ වෛද්‍යමය අරමුණු සඳහා භාවිත කරන ඖෂධ ( පෙති වර්ග සහ සිරප් වර්ග) භාවිත කරනු ලබයි. මෙවැනි පසුබිමක් තුළ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ස්වභාවය, ප්‍රවණතා හා රටා හඳුනාගැනීම සඳහා මත්ද්‍රව්‍ය භාවිතය හා මත්ද්‍රව්‍ය අලෙවිය හේතුවෙන් අත්අඩංගුවට ගැනීම් වැඩි සංඛ්‍යාවක් වාර්තා වන කොළඹ දිස්ත්‍රික්කයේ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු බහුලව සිදුකෙරෙමින් පැවති කොළඹ 01, කොළඹ 02, කොළඹ 03, කොළඹ 05, කොළඹ 08, රාජගිරිය යන ප්‍රදේශවල සමාගම් පහක් යටතේ වූ වැඩබිම් අටක් කේන්ද්‍ර කරගනිමින් පර්යේෂණයක් සිදුකරනු ලැබිණ.

එක් වැඩබිමකින් කම්කරුවන් පනස් දෙනෙකු බැගින් වැඩබිම් අට තුළින් කම්කරුවන් 400 දෙනෙකු අධ්‍යයන නියැදියට තෝරාගනු ලැබිණ. අරමුණුගත නියැදි ක්‍රමය භාවිත කරමින් එක් වැඩබිමකින් මූලික තොරතුරු සපයන්නන් හත්දෙනෙකු බැගින් වැඩබිම් තුළ විවිධ සේවා සපයනු ලබන 56 දෙනෙකු මූලික තොරතුරු සපයන්නන් ලෙස අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබිණ. සමීක්ෂණ ක්‍රමය භාවිත කරමින් සිදුකරන ලද මෙම අධ්‍යයනයෙහි දී ව්‍යුහගත ප්‍රශ්නාවලි, ගැඹුරු සම්මුඛ සාකච්ඡා සහ සහභාගිත්ව නිරීක්ෂණය ප්‍රාථමික දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම ලෙස භාවිත කරන ලද අතර පොත් පත්, සංඛ්‍යාලේඛන වාර්තා සහ අන්තර්ජාලය භාවිත කරමින් ද්විතියික දත්ත රැස්කර ගන්නා ලදි. රැස්කරගන්නා ලද ප්‍රමාණාත්මක දත්ත SPSS මෘදුකාංගය භාවිත කරමින් විශ්ලේෂණය කර ඇත.

අධ්‍යයන අනාවරණයන්ට අනුව ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සේවයේ නියුතු මත්ද්‍රව්‍ය භාවිත කරන කම්කරුවන් වව්නියා දිස්ත්‍රික්කයෙන් හැර සෙසු සියලු දිස්ත්‍රික්කවලින් නියෝජනය විය. බහුතරයක් එනම්, කම්කරුවන් 179 (45%) දෙනෙක් සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථානවල නවාතැන්ගෙන සිටි අතර බහුතරයක් කම්කරුවන් වයස අවුරුදු 36 - 40 ත් අතර වයස් කාණ්ඩයෙහි පසුවන්නන් විය. දෙසිය පණස් හයක් (64%) වැනි බහුතරයක් විවාහකයන් විය. දහදෙනෙක් (3%) වැනි අඩු කම්කරුවන් පිරිසක් පමණක් අධ්‍යාපනය ලබා නොතිබූ අතර සෙසු සියලු කම්කරුවන් කිසියම් හෝ අධ්‍යාපන මට්ටමක් ලබා තිබිණ. බහුතරයක් එනම්, 206 (51%) ක් පුහුණු ශ්‍රමිකයන් ලෙස රැකියාවෙහි නිරත වන්නන් විය.

කම්කරුවන් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරනු ලබන්නන් බව අධ්‍යයනය තුළින් අනාවරණය විය. එමෙන්ම ඔවුන් අතර මත්ද්‍රව්‍ය භාවිතයෙහි ඉහළ ප්‍රවණතාවක් පවතින බවක් හඳුනාගත හැකි විය. කම්කරුවන් විසින් නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ලෙස ගැනෙන කේරළ ගංජා, දේශීය ගංජා, සහ හෙරොයින්බහුලව භාවිත කරනු ලබන බවත් කේරල ගංජා භාවිත කිරීමේ ඉහළම ප්‍රවණතාවක් පවතින බවත් හඳුනාගත හැකි විය. එමෙන්ම නීත්‍යානුකූල මද්‍යසාර, වෛද්‍යමය අරමුණු සඳහා ගැනෙන ඖෂධ (පෙති වර්ග), දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන, හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් බහුලව භාවිතයෙහි ප්‍රවණතාවක් පවතින බවත් අධ්‍යයනය තුළින් අනාවරණය විය. නීත්‍යනුකූල මද්‍යසාර, දේශීය ගංජා, කේරළ ගංජා, දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන, මත්පෙති සහ හෙරොයින් ද කම්කරුවන් අතර ප්‍රචලිතව පවතින මත්ද්‍රව්‍ය ලෙස හඳුනාගත හැකි විය. පෙර සඳහන් කරන ලද මත්ද්‍රව්‍යන්ට සාපේක්ෂව එල්.එස්.ඩී (LSD) සහ සිරප් වර්ග භාවිතයෙහි අඩු ප්‍රචලිත බවක් පවතින බව

ද ප්‍රාථමික මත්ද්‍රව්‍යක් ලෙස ගැනෙන සිගරට් භාවිතයෙහි ඉහළ ප්‍රවණතාවක් පවතින බව ද හඳුනාගත හැකි විය.

දැනට කේරල ගංජා භාවිත කරන කම්කරුවන්ගෙන් බහුතරයක් තම අවශ්‍යතාව සඳහා සේවා ස්ථානය තුළ වූ මිතුරන්ගෙන් කේරල ගංජා සපයාගැනීමේ ඉහළ ප්‍රවණතාවයක් පවතින බවත් දැනට ඖෂධ (පෙති වර්ග) භාවිත කරන කම්කරුවන්ගෙන් බහුතරයක් පෞද්ගලික ඖෂධහල්වලින් ඖෂධ (පෙති වර්ග) ලබාගන්නා බවත් හඳුනාගත හැකි විය.

පුහුණු ශ්‍රමිකයන් ලෙස සේවය කරනු ලබන කම්කරුවන් අතර මත්ද්‍රව්‍ය භාවිතයෙහි ඉහළම ප්‍රවණතාවක් පවතින බව අනාවරණය විය. සේවය සඳහා පැමිණි කෙදිනක හෝ කිසිදු මත්ද්‍රව්‍යයක් භාවිත කර නොමැති පුද්ගලයින් හට මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමුවීම සඳහා සේවායෝජක එමෙන්ම ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම්වල සේවයෙහි නියුතු මත්ද්‍රව්‍ය භාවිත කරන කම්කරුවන් ද බලපෑමක් වී ඇති බව හඳුනාගත හැකි විය.

කම්කරුවන් 201 (50%) දෙනෙකුගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සේවා ස්ථානයේ නිලධාරීන් දැනුවත්වී තිබූ බවට අධ්‍යයනය තුළින් තොරතුරු අනාවරණය විය.කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සේවා ස්ථානයේ නිලධාරීන් දැනුවත්වීමත් සමඟ නිලධාරීන් විසින් කම්කරුවන් සම්බන්ධයෙන් අවවාද කිරීම, බැනවැදීම, උපදෙස් දීම, දඩ මුදල් නියම කිරීම, සේවය අත්හිටුවීම, සේවයෙන් ඉවත් කිරීම යනා දී පියවර ගෙන තිබූ බවට තොරතුරු අනාවරණය විය.

කම්කරුවන් තම මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ විවිධ වූ නීතිවිරෝධී ක්‍රියාවන් සේවා ස්ථානයෙන් පිටතදී පමණක් නොව සේවා ස්ථානය තුළ දී ද සිදුකරන බව අනාවරණය කරගත හැකි විය. සේවා ස්ථානයේ සෙසු සේවකයන්ට පහරදීම, සොරකම් කිරීම, මත්ද්‍රව්‍ය අලෙවි කිරීම, දේපලවලට හානි කිරීම සහ මත්ද්‍රව්‍ය අලෙවියට සහය වීම යන වැරදි සේවා ස්ථානය තුළ සිදුකරනු ලැබ තිබූ වැරදි ක්‍රියා ලෙස හඳුනාගත හැකි විය.

මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් කම්කරුවන් සේවා ස්ථානයෙහි දී විවිධ ගැටලුවලට මුහුණ දී ඇති බව අනාවරණය විය. සෙසු සේවකයින් සමඟ ගැටුම් ඇති කරගැනීම, අඛණ්ඩව සේවයට වාර්තා කිරීමට නොහැකි වීම, සේවා කටයුතු නිසි පරිදි ඉටුකිරීමට නොහැකි වීම, සුළු අනතුරුවලට මුහුණ දීම, නිලධාරීන් සමඟ මත ගැටුම් ඇති කරගැනීම සහ සේවා ස්ථානයේ සෙසු සේවකයන් අතර තමා කොන් වීම යන ගැටලුවලටකම්කරුවන් තම මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් සේවා ස්ථානයෙහි දී මුහුණ දී තිබිණ.

# 1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මත්ද්‍රව්‍ය දුර්භාවිතය පාලනය හා නිවාරණය සම්බන්ධයෙන් කේන්ද්‍රීය ආයතනය ලෙස අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය කටයුතු කරන අතර මත්ද්‍රව්‍ය ආශ්‍රිත කාලීන ප්‍රවණතා හඳුනාගැනීම සඳහා විවිධ ක්ෂේත්‍ර ආශ්‍රිතව පර්යේෂණ හා සමීක්ෂණ සිදුකිරීම එහි පර්යේෂණ අංශය මඟින් සිදුකරනු ලබන එක් ප්‍රධාන කාර්යයක් වේ.

අතුරු ප්‍රශ්න රැසක් නිර්මාණය වීමට හේතු වී ඇති මත්ද්‍රව්‍ය භාවිතය විවිධ ක්ෂේත්‍රයන් තුළ සේවයෙහි නියුතු පුද්ගලයින් අතර හඳුනාගත හැකිය. මත්ද්‍රව්‍ය ආශ්‍රිත අත්අඩංගුවට ගැනීම් පිළිබඳ දත්ත සහ මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ප්‍රතිකාර ලබන තැනැත්තන්ගේ වාර්තාගත දත්ත අනුව ඔවුන්ගේ එක් එක් රැකියා තත්ත්වය විශ්ලේෂණය කිරීමේ දී බහුතරය කම්කරු සේවයෙහි නියුක්තවූවන් බව හඳුනාගත හැකි අතර ඒ අනුව කම්කරුවන් අතර මත්ද්‍රව්‍ය භාවිතයෙහි ඉහළ ප්‍රවණතාවක් හා ව්‍යාප්තියක් පවතින බව තහවුරු වේ.

කම්කරුවන් ගත් කල ඔවුන් සමාජයේ විවිධ ක්ෂේත්‍ර තුළ කම්කරු සේවයෙහි නියැලී සිටියි. ඔවුන් සේවය කරනු ලබන ක්ෂේත්‍ර අතරින් එක් ක්ෂේත්‍රයක් ලෙස ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය හඳුනාගත හැකිය. ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ගෝලීය සමාජ ප්‍රශ්නයකි. ශ්‍රී ලංකාවේද ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නියුතු කම්කරුවන් අතර මත්ද්‍රව්‍ය දුර්භාවිතයෙහි ප්‍රවණතාවක් පවතින බවට අවිධිමත් ආකාරයට තොරතුරු වාර්තා වේ.

ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නිරත කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් පර්යේෂණ අධ්‍යයන හා සමීක්ෂණ සිදුකර නොමැති අතර එබැවින් ඒ සම්බන්ධයෙන් පවතින විධිමත් දැනුමද අල්ප වේ. ඒ අනුව ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නිරත කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් පර්යේෂණ සිදුකිරීම කාලීන වශයෙන් ඉතා වැදගත් වේ. මෙම තත්ත්වය තුළ පර්යේෂණ අංශය විසින් ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නිරත කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා හා රටා හඳුනාගැනීම සඳහා මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කරන ලදි.

## 1.1 අධ්‍යයන පසුබිම

සමාජ වෙනස්වීමේ කාරක වන නාගරීකරණය, නවීකරණය, කාර්මීකරණය සහ ගෝලීයකරණය යනාදියෙහි ප්‍රතිඵලයක් ලෙස සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින ලොව බොහෝ රටවල ඉදිකිරීම් ක්ෂේත්‍රය යටතේ ගොඩනැගිලි ඉදිකිරීම්, සිවිල් ඉදිකිරීම් සහ කර්මාන්ත ඉදිකිරීම් හඳුනාගතහැකි වේ. ඒ අතරින් ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය ගත් කළ වර්තමානය වන විට ඒ ආශ්‍රිත විවිධ සමාජ සංකීර්ණතා ඇතිවීමේ පසුබිමක් හඳුනාගත හැකිය. එම සංකීර්ණතා අතර උද්ගතව ඇති එමෙන්ම ආමන්ත්‍රණයට ලක් කළ යුතු සමාජ ප්‍රශ්නයක් ලෙස කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හඳුනාගත හැකිය.

ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවය කරනු ලබන පුද්ගලයින් ප්‍රධාන කාණ්ඩ ත්‍රිත්වයක් යටතේ හඳුනාගතහැකි වේ. එනම් , කළමනාකරණ සහ තාක්ෂණික (Management and technical work force), පුහුණු ශ්‍රමික (Skilled),අර්ධ පුහුණු ශ්‍රමික සහනුපුහුණු ශ්‍රමික(Semiskilled and unskilled) .(civilatwork.blogspot.com/2015/05/types-of-labour-employed-in.html).මෙම වර්ගීකරණයෙහි දෙවන සහ තෙවන කාණ්ඩයට අයත් ශ්‍රමිකයින් මත්ද්‍රව්‍ය භාවිත කරන බවට තොරතුරු වාර්තා වේ.

ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම් යනු සැලකිය යුතු සංඛ්‍යාවක් ඉදිකිරීමේ කටයුතුවල නිරත වන ස්ථානයකි. ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම්වල අනතුරුදායක යන්ත්‍රෝපකරණ භාවිත කරනු ලබන අතර සුළු මොහොතකට හෝ අවධානය නොමැති වුවහොත් අනතුරු සිදුවීමේ ඉඩකඩ වැඩිය. එමනිසා මත්ද්‍රව්‍ය භාවිතය ගොඩනැගිලි ඉදිකිරීමේ සේවා ස්ථානයන්හි දී බරපතල ප්‍රශ්නයක් විය හැකිය. කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිත කිරීම සැලකිය යුතු සෞඛ්‍ය ගැටලු ඇති කිරීමට පමණක් නොව එහි බලපෑමට ලක්වන ඕනෑම තැනැත්තෙකු තමන්ට සහ අන්අයට අනතුරක් වීමට හේතු විය හැකිය. අපරාධ සහ ප්‍රචණ්ඩ ක්‍රියා , සොරකම් වැනි නීතිවිරෝධී ක්‍රියාවන් ද මත්ද්‍රව්‍ය භාවිතයෙහි

අතුරු ප්‍රතිඵල ලෙස උද්ගත විය හැකිය. මත්පැන් භාවිතයේ සහ මත්ද්‍රව්‍ය භාවිතයේ ඓතිහාසික පසුබිමක් සහිත කම්කරුවන් අතර අපරාධ හා ප්‍රචණ්ඩ ක්‍රියා සිදුවේ (Mushi.F.V & Manege S.L,2018:66).ගොඩනැගිලි ඉදිකිරීමේ සේවා ස්ථානවල මත්ද්‍රව්‍ය භාවිතය පොදු සංසිද්ධියක් වීමෙන් විවිධ රෝගාබාධ ඇතිවීම, තුවාල සිදුවීම, රැකියාවට නොපැමිණීම, ආබාධිතවීම වැනි ගැටලුවලට මුහුණ දීමට සිදුවන අතර ඵලදායීතාව අඩුවීමට ද හේතු වේ (Gavioli.A,Mathias.T.A,Rossi.R.M & Oliveira.M.L,2014:472,accessed 2018/02/18).

ඉදිකිරීමේ කර්මාන්තයේ සේවකයන්ගේ මත්පැන් භාවිතය, මත්ද්‍රව්‍ය භාවිතය, දුම්කොළ හා දුම්පානය සාමාන්‍ය මට්මට වඩා ඉහළ අගයක පවතින බවට අධ්‍යයන තුළින් අනාවරණය වී ඇත(Alberta Addiction and Mental Health Research Partnership Programme,2010:9). එමෙන්ම කම්කරුවන් අතර ගංජා සහ ඇම්පිටමින් භාවිතයෙහි ඉහළ මට්ටමක් පවතින බවට ද අනාවරණය වී ඇත( Banwell.C,Dance.P,Quinn.C,Davies.R & Hall.D,2009:167-178). ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම්වල සේවය කරන කම්කරුවන් නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය පමණක් නොව නීත්‍යානුකූල මත්ද්‍රව්‍ය ද භාවිත කරන බවට තොරතුරු වාර්තා වේ. සේවා ස්ථානයන්හි දී නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය දුර්භාවිතය පමණක් නොව නීත්‍යානුකූල මත්ද්‍රව්‍ය භාවිතය ද පෙර සඳහන් කරන ලද ගැටලු ඇති වීම කෙරෙහි හේතු විය හැකිය.

ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම්වල සේවය කරන කම්කරුවන් භාවිත කරන මත්ද්‍රව්‍ය වර්ග, කම්කරු මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතා හා රටා, මත්ද්‍රව්‍ය භාවිත කරන කම්කරුවන්ගේ සමාජ ප්‍රජා පැතිකඩ, සේවා ස්ථාන තුළ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් ගොඩනැගී ඇති පරිසරයෙහි ස්වභාවය සහ ඒ ආශ්‍රිතව නිර්මාණය වී පවතින ගැටලු විද්‍යාත්මක පදනමක සිට අධ්‍යයනය කිරීම මඟින් ඒ සම්බන්ධ විධිමත් දැනුම ගොඩනැගීමට සහ ප්‍රතිපත්ති සැලසුම් කිරීම සඳහා මෙම අධ්‍යයනය ක්‍රියාත්මක කරන ලදි.

## 1.2 පර්යේෂණ ගැටලුව

ශ්‍රී ලංකාවේ ගොඩනැඩනැගිලි ඉදිකිරීම් ක්ෂෙත්‍රයෙහි සේවයෙහි නියුතු කම්කරුවන් මත්ද්‍රව්‍ය භාවිත කරන බවට අවිධිමත් ආකාරයට තොරතුරු වාර්තා වුවද ඒ සම්බන්ධ විධිමත් දැනුම සහ සංඛ්‍යාත්මක තොරතුරු අවම මට්ටමක පවතී. එබැවින් උක්ත කාරණය සම්බන්ධ විද්‍යාත්මක පදනමකින් යුතුව දැනුම ගොඩනැගීම සඳහා සිදුකරන ලද මෙම අධ්‍යයනයෙහි කේන්ද්‍රීය ගැටලුව වූයේ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂෙත්‍රයේ සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය දුර්භාවිතයෙහි වර්තමාන රටා සහ ප්‍රවණතා මොනවාද? යන්නයි. ප්‍රධාන ගැටලුවට අතිරේකව අධ්‍යයනය කරන ලද උප පර්යේෂණ ගැටලු පහත පරිදි විය.

**උප පර්යේෂණ ගැටලු 01** - කම්කරුවන්ගේමත්ද්‍රව්‍ය භාවිතය හා ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂෙත්‍රයෙහි සේවා කටයුතු අතර පවත්නා සම්බන්ධය කෙබඳු ද?

## 1.3 පර්යේෂණ අරමුණු

**ප්‍රධාන පර්යේෂණ අරමුණ**

ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂෙත්‍රයේ සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ස්වභාවය, ප්‍රවණතා හා රටා හඳුනාගැනීම.

**සුවිශේෂී පර්යේෂණ අරමුණු**

1. ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම්වල සේවයෙහි නියුතු මත්ද්‍රව්‍ය භාවිත කරන කම්කරුවන්ගේ ප්‍රජා හා සමාජ පැතිකඩ හඳුනාගැනීම.

2. කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හා ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු අතර සබඳතාවය හා ඒ ආශ්‍රිතව උද්ගතව ඇති මූලික ගැටලු හඳුනාගැනීම.

3. ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නියුතු කම්කරුවන් මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීම වැළැක්වීම හා නිවාරණය උදෙසා අදාළ ප්‍රතිපත්ති සම්පාදනයට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

## 1.4 පර්යේෂණ ප්‍රශ්න

**පර්යේෂණ ප්‍රශ්න 01**

ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතුවල සේවයෙහි නිරත මත්ද්‍රව්‍ය භාවිත කරන කම්කරුවන්ගේ ප්‍රජා සමාජ පැතිකඩ කෙබඳු ද?

**පර්යේෂණ ප්‍රශ්න 02**

ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නියතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටාවන්හි ස්වභාවය කෙබඳු ද?

**පර්යේෂණ ප්‍රශ්න 03**

ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි නව ප්‍රවණතා මොනවාද?

**පර්යේෂණ ප්‍රශ්න 04**

මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් කම්කරුවන් දරණ මිත්‍යා විශ්වාස මොනවාද?

**පර්යේෂණ ප්‍රශ්න 05**

මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ කම්කරුවන් මුහුණ දී ඇති ගැටලු මොනවාද?

## 1.5 පර්යේෂණ සාධාරණීකරණය හා උපයෝගීතාව

ලෝකයේ මෙන්ම ලංකාවේ ද මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ගේ සේවා අංශ පිළිබඳව සලකා බැලීමේදී බහුතරය කම්කරු සේවයෙහි නියුතු වූවන් බව අනාවරණය වී ඇත. ඔවුන් විවිධ ක්ෂේත්‍ර තුළ සේවය සපයන්නන් වන අතර ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය එයින් එක් ක්ෂේත්‍රයකි. ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම් යනු සැලකිය යුතු පිරිසක් සේවය කරනු ලබන අනතුරුදායක යන්ත්‍ර භාවිත කරන ස්ථානයකි. එබැවින් යම් පුද්ගලයෙක් මත්ද්‍රව්‍ය භාවිතකර සේවයේ නිරත වීම තමා පමණක් නොව සෙසු පුද්ගලයන් ද අවධානමකට ලක් කිරීමකි. එය සමස්ත සේවා කණ්ඩායමටම ගැටලුවක් විය හැකිය. මත්ද්‍රව්‍ය භාවිත කරන කම්කරුවන් මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ සංස්කෘතියක් වැඩබිම් තුළ නිර්මාණය කරගෙන ඇති බවට ද්විතියීක මූලාශ්‍ර සාක්ෂි දරයි. කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ අතුරු ප්‍රශ්න නිර්මාණය විය හැකි අතර ලොව තුළ සිදු කරන ලද අධ්‍යයන තුළින් එය තහවුරු වී ඇත.

මත්පැන් සම්බන්ධව ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට සහ නිවාරණ ක්‍රියාකාරකම් බලගැන්වීම සඳහා අධ්‍යයන අනාවරණ ඉදිරිපත් කෙරෙන අතර නිවාරණය තුළ ගොඩනැගිලි ඉදිකිරිම් වැඩබිම්වල සේවයෙහි නියුතු කම්කරුවන් කෙරෙහි පවත්නා අවධානය පුළුල් කිරීම ද අත්‍යාවශ්‍ය වේ. තවද සෞඛ්‍ය වැඩසටහන් සැලසුම් කිරීමට සහ නීතිය ක්‍රියාත්මක කරන අංශවලට අවශ්‍ය අනාගත සැලසුම් සකස් කිරීමට ද පදනමක් වශයෙන් යොදා ගත හැකිය.

## 1.6 පර්යේෂණ ක්‍රමවේදය

මෙම අධ්‍යයනයෙහි දී ප්‍රපංචවේදීමය පර්යේෂණ ක්‍රමවේදය (Phenomenological research methodology) යොදාගනු ලැබිණ. ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතුවල සේවයෙහි නිරත මත්ද්‍රව්‍ය

භාවිත කරන කම්කරුවන්ගේ ප්‍රජා සමාජ පැතිකඩ පිළිබඳවත්, කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි රටා සහ නව ප්‍රවණතා පිළිබඳවත්,මත්ද්‍රව්‍ය භාවිතය හා ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවා කටයුතු අතර පවත්නා සම්බන්ධතාවය පිළිබඳවත් එමෙන්ම මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ ගැටලු උද්ගත වී පවතීනම් ඒවායෙහි ස්වභාවය පිළිබඳවත් වඩාත් ගැඹුරින් අධ්‍යයනය කිරීම සඳහා මෙම ක්‍රමවේදය භාවිත කරනු ලැබිණ. මෙහිදී පර්යේෂණ ක්‍රමය ලෙස සමීක්ෂණ ක්‍රමය (Survey method) භාවිත කරනු ලැබිණ.

### 1.7 අධ්‍යයන ක්ෂේත්‍රය

මෙම අධ්‍යයනයෙහි දී අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස කොළඹ දිස්ත්‍රික්කයේ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු බහුලව සිදුකෙරෙමින් පැවති කොළඹ 01, කොළඹ 02, කොළඹ 03, කොළඹ 05, කොළඹ08, රාජගිරිය යන ප්‍රදේශ තෝරාගනු ලැබිණ. කොළඹ දිස්ත්‍රික්කය තුළ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු බහුලව සිදුවෙමින් පැවතීමත් එමෙන්ම වාර්තාගත සංඛ්‍යාලේඛනවලට අනුව අන්තරායකර ඖෂධ දුර්භාවිතයෙහි ඉහළ ව්‍යාප්තියක් කොළඹ දිස්ත්‍රික්කය තුළ පෙන්නුම් කිරීමත් යන හේතූන් මත පදනම්ව ඉහත සඳහන් ප්‍රදේශ අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස තෝරාගනු ලැබිණ.

### 1.8 අධ්‍යයන නියැදිය

කොළඹ දිස්ත්‍රික්කය තුළ ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු සමාගම් ගණනාවක් යටතේ සිදුවෙමින් පැවති අතර එයින් ප්‍රධාන සමාගම් පහක් අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබිණ. තෝරාගනු ලැබූ සමාගම්වලට අදාල ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු සිදුකෙරෙමින් පැවති වැඩබිම් අතරින් එකම භූගෝලීය ප්‍රදේශයක පිහිටි වැඩබිම් අටක් පොකුරු නියැදියක් ලෙස තෝරාගනු ලැබිණ. එම වැඩබිම් පිහිටි ප්‍රදේශ වූයේ කොළඹ 01, කොළඹ 02, කොළඹ 03, කොළඹ 05, කොළඹ 08, සහ රාජගිරිය වේ. එම ප්‍රදේශ අධ්‍යයනයේ ශක්‍යතාවය සඳහා තෝරාගනු ලැබූ අතර එක් එක් ප්‍රදේශ තුළින් තෝරාගනු ලැබූ වැඩබිම් ප්‍රමාණ පහත පරිදි විය.

**වගු අංක 01 - අධ්‍යයනයට අයත් එක් එක් ප්‍රදේශ තුළින් තෝරාගනු ලැබූ වැඩබිම් ප්‍රමාණ**

| වැඩබිම් පිහිටි ප්‍රදේශ | තෝරාගනු ලැබූ වැඩබිම් ගණන |
|---|---|
| කොළඹ 01 | 02 |
| කොළඹ 02 | 02 |
| කොළඹ 03 | 01 |
| කොළඹ 05 | 01 |
| කොළඹ 08 | 01 |
| රාජගිරිය | 01 |
| **එකතුව** | **08** |

ඉහත වගුවෙහි සඳහන් කරන ලද වැඩබිම්වල කම්කරු සේවයෙහි නියුතු දැනට යම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන කම්කරුවන් අතරින් අහඹු ලෙස එක් වැඩබිමකින් කම්කරුවන් පනස් දෙනෙකු බැගින් වැඩබිම් අට තුළින් කම්කරුවන් 400 දෙනෙකු අධ්‍යයන නියැදියට තෝරාගනු ලැබිණ.

අරමුණුගත නියැදි ක්‍රමය භාවිත කරමින් එක් වැඩබිමකින් මූලික තොරතුරු සපයන්නන් හත්දෙනෙකු බැගින් වැඩබිම් තුළ විවිධ සේවා සපයනු ලබන 56 දෙනෙකු මූලික තොරතුරු සපයන්නන් ලෙස

අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබිණ. එක් වැඩබිමකින් පහත වගුවෙහි සඳහන් සංයුතිය පරිදි මූලික තොරතුරු සපයන්නන් අධ්‍යයනය සඳහා තෝරාගනු ලැබිණ.

**වගු අංක 02 - අධ්‍යයනය සඳහා තෝරා ගනු ලැබූ මූලික තොරතුරු සපයන්නන්ගේ සංයුතිය**

| අනු අංකය | වෘත්තිය | එක් වැඩබිමකින් තෝරාගන්නා ලද මූලික තොරතුරු සපයන්නන් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ඉංජිනේරුවරු | 02 |
| 02 | ආරක්ෂක නිලධාරි (Security officer) | 01 |
| 03 | වැඩ සුපරික්ෂකවරු | 01 |
| 04 | තාක්ෂණික සේවා සපයන්නන් | 01 |
| 05 | ආරක්ෂක නිලධාරි (Safety officer) | 01 |

### 1.9 දත්ත රැස්කිරීම
සමීක්ෂණ ක්‍රමය භාවිත කරමින් සිදුකරන ලද මෙම අධ්‍යයනයෙහි දී ප්‍රාථමික දත්ත සහ ද්විතියික දත්ත භාවිත කරන ලදි. ව්‍යුහගත ප්‍රශ්නාවලි, ගැඹුරු සම්මුඛ සාකච්ඡා සහ සහභාගිත්ව නිරීක්ෂණය ප්‍රාථමික දත්ත රැස්කිරීමේ ශිල්ප ක්‍රම ලෙස භාවිත කරන ලද අතර පොත් පත් , සංඛ්‍යා ලේඛන වාර්තා සහ අන්තර්ජාලය භාවිත කරමින් ද්විතියික දත්ත රැස්කර ගන්නා ලදි.

### 1.10 දත්ත විශ්ලේෂණය
ව්‍යුහගත ප්‍රශ්නාවලි මඟින් රැස්කරගන්නා ලද ප්‍රමාණාත්මක දත්ත SPSS මෘදුකාංගය භාවිත කරමින් විශ්ලේෂණය කර ඇත. ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය කිරීමේ දී විචල්‍ය අතර සහසම්බන්ධතාවය (Correlation) ප්‍රමාණාත්මකව ඉදිරිපත් කර ඇත.

## 2 අධ්‍යයන ප්‍රතිඵල හා සාකච්ඡාව
පර්යේෂණයෙහි මුඛ්‍ය අරමුණ සහ සුවිශේෂී අරමුණු ඉටුකරගැනීම සඳහා තෝරා ගන්නා ලද නියැදියට ඇතුළත් ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නියුතු දැනට යම් මත්ද්‍රව්‍යක් භාවිත කරනු ලබන කම්කරුවන් 400 දෙනාගේ ප්‍රජා හා සමාජ පැතිකඩ, ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයෙහි ස්වභාවය, ප්‍රවණතා හා රටා සහ සෙසු පර්යේෂණ අනාවරණ පහත සඳහන් තේමා යටතේ මෙම පරිච්ඡේදයෙහි දී ඉදිරිපත් කර ඇත.

1. දත්ත දායකයින්ගේ ප්‍රජා හා සමාජ පැතිකඩ

2. ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටාවන්

3. ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම් තුළ කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත ප්‍රවණතා සහ පුද්ගල චර්යාවේ ස්වභාවය

**2.1දත්තදායකයින්ගේ ප්‍රජා හා සමාජ පැතිකඩ**

**2.1.1 පදිංචි දිස්ත්‍රික්ක අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තියෙහි සංයුතිය**

පොකුරු නියැදි ක්‍රමය භාවිත කරමින් තෝරාගන්නා ලද වැඩබිම් අට තුළ කම්කරු සේවයෙහි නියුතු දැනට යම් මත්ද්‍රව්‍යක් භාවිත කරන කම්කරුවන් අතරින් එක් වැඩබිමකින් කම්කරුවන් 50 දෙනෙකු බැගින් අහඹු ලෙස කම්කරුවන් 400 දෙනෙකු අධ්‍යනය සඳහා තෝරාගනු ලැබිණ. ඔවුන්ගේ පදිංචිය සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය විය.

අධ්‍යයන දත්තවලට අනුව නියදිය තුළ නියෝජනය වූ දත්ත දායකයින්ගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය සළකා බැලීමේදී දත්තදායකයින් වව්නියා දිස්ත්‍රික්කයෙන් හැර සෙසු සියලු දිස්ත්‍රික්කවලින් නියෝජනය වීම විශේෂ කරුණකි. 101 (25%) වැනි බහුතර පුද්ගල සංඛ්‍යාවක් කොළඹ දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවන් වූ අතර පුද්ගලයන් 35 (9%) දෙනෙක් රත්නපුර දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවන් විය. නුවර දිස්ත්‍රික්කයේ සහ ගම්පහ දිස්ත්‍රික්කයේ ස්ථිර පදංචිකරුවන් වූ පුද්ගල සංඛ්‍යාව පිළිවෙලින් 24 (6%) සහ 23 (6%) ක් විය. කළුතර දිස්ත්‍රික්කයේ සහ කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ පුද්ගලයන් 19 (5%) බැගින් එක් එක් දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචිකරුවන් විය. නියදියට ඇතුළත් දත්ත දායකයින්ගෙන් පුද්ගලයින් 18 (5%) දෙනා බැගින් අනුරාධපුරය, කුරුණෑගල, සහ නුවරඑළිය යන එක් එක් දිස්ත්‍රික්කවල ස්ථිර පදිංචිකරුවන් වූ අතර අඩුම පුද්ගල සංඛ්‍යාවක් එනම්, එක් පුද්ගලයෙකු (0. 2%) පමණක් මන්නාරම දිස්ත්‍රික්කයේ ස්ථිර පදිංචිකරුවකු විය. සෙසු පුද්ගලයින් අනෙකුත් දිස්ත්‍රික්කවලින් පහත වගුවෙහි සඳහන් පරිදි නියෝජනය විය.


**වගු අංක 03 - පදිංචි දිස්ත්‍රික්ක අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තියෙහි සංයුතිය**

| දිස්ත්‍රික්කය | සංඛ්‍යාව | % |
|---|---|---|
| කොළඹ | 101 | 25.25 |
| රත්නපුර | 35 | 8.75 |
| මහනුවර | 24 | 6 |
| ගම්පහ | 23 | 5.75 |
| කළුතර | 19 | 4.75 |
| කිලිනොච්චිය | 19 | 4.75 |
| අනුරාධපුර | 18 | 4.5 |
| කුරුණෑගල | 18 | 4.5 |
| නුවරඑළිය | 18 | 4.5 |
| මාතර | 15 | 3.75 |
| ගාල්ල | 14 | 3.5 |
| බදුල්ල | 12 | 3 |
| මඩකලපුව | 11 | 2.75 |
| මාතලේ | 11 | 2.75 |
| හම්බන්තොට | 10 | 2.5 |
| අම්පාර | 9 | 2.25 |
| මොණරාගල | 9 | 2.25 |
| කෑගල්ල | 8 | 2 |
| පොළොන්නරුව | 8 | 2 |
| යාපනය | 5 | 1.25 |
| මුලතිව් | 4 | 1 |
| පුත්තලම | 4 | 1 |

| | | |
|---|---|---|
| ත්‍රිකුණාමලය | 4 | 1 |
| මන්නාරම | 1 | 0.25 |
| **මුළු එකතුව** | **400** | **100** |
| | | |

**මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

**සිතියම් අංක 01 - පදිංචි දිස්ත්‍රික්ක අනුව දත්ත දායකයින්ගේ ව්‍යාප්තිය**





**මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

### 2.1.2 වාසස්ථාන අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ දත්තදායකයින්ගේ වාසස්ථානවල ව්‍යාප්තිය සළකාබැලීමේ දී බහුතරයක් එනම් , පුද්ගලයින් 179 (45%) දෙනෙක් සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථානවල නවාතැන්ගෙන සිටින අතර 103 ( 26%) දෙනෙක් කුලී පදනම මත ලබාගත් නිවාසවල නවාතැන් ගෙන සිටියහ. සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථාන වැඩ බිම් පිහිටි භූමිය තුළ සහ වැඩ බිම පිහිටි ප්‍රදේශයට නුදුරින් පිහිටි වෙනත් ස්ථානයක තිබීම හඳුනාගත හැකි විය. තම නිවසේ වාසය කරන පුද්ගලයින් සංඛ්‍යාව 59 (15%) දෙනෙක් වූ අතර මිතුරකුගේ නිවසේ නවාතැන්ගෙන සිටින පුද්ගල සංඛ්‍යාව 38 (10%) දෙනෙක් විය. ඊට අමතරව ඥාති නිවෙසක වාසය කරන පුද්ගල සංඛ්‍යාව 21 (5%) දෙනෙක් විය.

**ප්‍රස්තාර අංක 01 - වාසස්ථාන අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය**





**මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

සමස්ත දත්ත දායකයින් අතරින් බහුතර පුද්ගල සංඛ්‍යාවක් සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථානවල නවාතැන්ගෙන ඇති බව ඉහත විශ්ලේෂිත කරුණු අනුව පැහැදිලි වේ. ඔවුන් ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සේවා කටයුතු සඳහා ලංකාවේ විවිධ ප්‍රදේශවලින් කොළඹ නගරය කරා සංක්‍රමණය වූ පුද්ගලයන් වේ.

### 2.1.3 දත්තදායකයින්ගේ ස්ත්‍රී පුරුෂ සංයුතිය

අහඹු නියැදි ක්‍රමය භාවිත කරමින් අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලද දත්ත දායකයින්ගේ පුමිතිරි බව සලකා බැලීමේදී බහුතරයක් එනම්, 392 (98%) දෙනෙක් පුරුෂයන් වූ අතර 8 (2%) ක් වැනි අඩු සංඛ්‍යාවක් ස්ත්‍රීන් වූහ.

**ප්‍රස්තාර අංක 02 - දත්තදායකයින්ගේ ස්ත්‍රී පුරුෂ සංයුතිය**





**මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

### 2.1.4 දත්තදායකයින්ගේ වයස් සංයුතිය

අධ්‍යයන නියදිය සඳහා තෝරාගන්නා ලද පුද්ගලයන්ගේ වයස්සංයුතිය පිළිබඳ විශ්ලේෂණය කිරීමේදී බහුතරයක් එනම්, 90 (23%) දෙනෙක් වයස අවුරුදු 36-40 ත් අතර වයස් කාණ්ඩයට අයත් පුද්ගලයන් වූහ. පුද්ගලයන් 81 (20%) දෙනෙක් වයස අවුරුදු 31-35 ත් අතර වයස් කාණ්ඩයට අයත් වූ අතර 75 (19%) දෙනෙක් වයස අවුරුදු 26-30 ත් අතර වයස් කාණ්ඩයට අයත් වූහ. වයස අවුරුදු 41-45 ත් අතර වයස් කාණ්ඩයට අයත් පුද්ගලයන් 61 (15%) දෙනෙක්, වයස අවුරුදු 18-25 ත් අතර වයස් කාණ්ඩයට අයත් පුද්ගලයන් 53 (13%) දෙනෙක් සහ වයස අවුරුදු 46-70 අතර වයස් කාණ්ඩයට අයත් පුද්ගලයන් 40 (10%) දෙනෙක් අධ්‍යයනයට භාජනය කරන ලද නියැදිය තුළ නියෝජනය විය.

**ප්‍රස්තාර අංක 03 - දත්තදායකයින්ගේ වයස් සංයුතිය**





**මූලාශ්‍රයः (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

නියැදියට ඇතුළත් සමස්ත දත්ත දායකයින්ගේ වයස් ව්‍යුහය විශ්ලේෂණය කිරීමේදී පැහැදිලි වූ විශේෂ කරුණ නම් ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ මත්ද්‍රව්‍ය භාවිතය වයස අවුරුදු 36 - 40 ත් වයස් කාණ්ඩයට අයත් පුද්ගලයන් අතර බහුලව ප්‍රචලිත වී ඇති බවයි.

### 2.1.5 ජාතිය අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය

නියැදියට ඇතුළත් දත්ත දායකයින්ගේ ජනවාර්ගිකත්වය අනුව බහුතරයක් එනම්, 277 (69%) දෙනෙක් සිංහල ජාතිකයින් වූ අතර 96 (24%) ක් දෙමළ ද, 26 (7%) ක් මුස්ලිම් ද වූහ. මැලේ ජාතියට අයත් එක් පුද්ගලයෙකු (0.2%) පමණක් නියැදිය තුළ නියෝජනය විය.

ප්‍රස්තාර අංක 04 - ජාතිය අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය





මූලාශ්‍රයː (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

### 2.1.6 ආගම අනුව දත්ත දායකයින්ගේ ව්‍යාප්තිය

අධ්‍යයන නියැදියට ඇතුළත් දත්තදායකයින්ගේ ආගම අනුව 87 (22%) දෙනෙක් හින්දු ආගමිකයන් ද, 27 (7%) දෙනෙක් ඉස්ලාම් ආගමිකයන් ද, 38 (10%) දෙනෙක් ක්‍රිස්තියානි ආගමිකයන් ද වූ අතර 3 (1%) දෙනෙක් රෝමානු කතෝලිකයින් වූහ. බහුතරයක් එනම්, 245 (61%) දෙනෙක් බෞද්ධ ආගමිකයන් වූහ.

ප්‍රස්තාර අංක 05 - ආගම අනුව දත්ත දායකයින්ගේ ව්‍යාප්තිය





මූලාශ්‍රයː (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

### 2.1.7 දත්තදායකයින්ගේ විවාහක අවිවාහක තත්ත්වය

විවාහක අවිවාහක බව අනුව 107 (26%) දෙනෙක් අවිවාහකයන් ද 21 (5%) දෙනෙක් විවාහක එහෙත් වෙන්ව ජීවත්වන්නන් ද වූ අතර දික්කසාද සහ වැන්දඹු පුද්ගලයන් 6 (2%) දෙනා බැගින් ද නියදිය තුළ නියොජනය වූහ. අඩුම පුද්ගල සංඛ්‍යාවක් එනම්, 4 (1%) දෙනෙක් විවාහනොවී එකට ජීවත්වන්නන් වූ අතර බහුතරය එනම්, 256 (64%) ක් පුද්ගලයින් විවාහකයින් විය. ඒ අනුව ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂෙත්‍රයේ සේවයෙහි නියුතු අවිවාහක කම්කරුවන්ට වඩා විවාහක කම්කරුවන් අතර මත්ද්‍රව්‍ය භාවිතයෙහි ඉහළ ප්‍රචලිත බවක් ඇති බව ඉහත විශ්ලේෂණය තුළින් පැහැදිලි වේ.

**ප්‍රස්තාර අංක 06 - දත්තදායකයින්ගේ විවාහක අවිවාහක තත්ත්වය**





**මූලාශ්‍රයː (ක්ෂෙත්‍ර අධ්‍යයනය, 2018)**

### 2.1.8 අධ්‍යාපන මට්ටම අනුව දත්ත දායකයින්ගේ ව්‍යාප්තිය

අධ්‍යයන නියදිය තුළ නියෝජනය වූ පුද්ගලයන්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳ විශ්ලේෂණය කිරීමේ දී 20 (5%) දෙනෙක් අ. පො . ස උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලබා තිබූ අතර 121 (30%) දෙනෙක් අ. පො. ස. සාමාන්‍ය පෙළ දක්වා අධ්‍යාපනය ලබා තිබිණ. ඊට අතිරේකව පුද්ගලයන් 57 (14%) දෙනෙක් 1 වසර සිට 5 වසර දක්වා අධ්‍යාපනය ලබා තිබිණ. බහුතරයක් එනම්, 192 (48%) දෙනෙක් 10 වසර දක්වා අධ්‍යාපනය ලබා තිබූ අතර 10 (3%) දෙනෙක් වැනි අඩුම පුද්ගල සංඛ්‍යාවක් පමණක් අධ්‍යාපනය ලබා නොතිබුණි.

**ප්‍රස්තාර අංක 07 - අධ්‍යාපන මට්ටම අනුව දත්තදායකයින්ගේ ව්‍යාප්තිය**





**මූලාශ්‍රයː (ක්ෂෙත්‍ර අධ්‍යයනය, 2018)**

### 2.1.9 කම්කරුවන්ගේ රැකියා නියුක්තියෙහි ව්‍යාප්තිය

අධ්‍යයන නියැදියට ඇතුළත් වූ කම්කරුවන් ගොඩනැගිලි ඉදිකිරීමේ ක්ෂෙත්‍රයෙහි සේවය කිරීමේ දී විවිධ රැකියා තත්ත්වයන් යටතේ සේවයෙහි නියුක්තව ඇති බව අධ්‍යයනය තුළින් අනාවරණය විය. 206 (51%) දෙනෙක් වැනි බහුතර සංඛ්‍යාවක් පුහුණු ශ්‍රමිකයන් ලෙස රැකියාවෙහි නිරත වන අතර 140 (35%) දෙනෙක් නුපුහුණු ශ්‍රමිකයන් ලෙස සේවය කරනු ලබයි. ඊට අතිරේකව 54 (14%) දෙනෙක් අර්ධ පුහුණු ශ්‍රමිකයන් ලෙස සේවය කරනු ලබයි.

**ප්‍රස්තාර අංක 08 - කම්කරුවන්ගේ රැකියා නියුක්තියෙහි ව්‍යාප්තිය**




**මූලාශ්‍රයː (ක්ෂෙත්‍ර අධ්‍යයනය, 2018)**

පුහුණු ශ්‍රමිකයන් ලෙස සේවය කරනු ලබන කම්කරුවන් අතරින් බහුතරයක් එනම්, 118 (30%) දෙනෙක් පෙදරේරුවරුන් ලෙස සේවය කරනු ලබන අතර 24 (6%) දෙනෙක් යකඩ පැස්සුම්කරුවන් ලෙස සේවය කරනු ලබයි. කම්බි බැඳීමේ නිරතවන කම්කරුවන් 17 (4%) දෙනෙක් ද, වඩුවැඩ සිදුකරන කම්කරුවන් 16 (4%) දෙනෙක් ද, පුහුණු ශ්‍රමිකයන් අතර විය. ඊට අතිරේකව 14 (4%) දෙනෙක් විදුලි කාර්මිකයින් ලෙසද, 10 (3%) දෙනෙක් ගල් අතුරන්නන් ලෙස ද, 6 (2%) දෙනෙක්

තීන්ත ආලේප කරන්නන් ලෙස ද සේවය කරනු ලබන අතර එක් කම්කරුවෙක් ග්‍රයින්ඩර්කරුවකු ලෙස සේවය කරනු ලබයි.

අර්ධ පුහුණු ශ්‍රමිකයන් ලෙස සේවයෙහි නියුතු කම්කරුවන්ගේ ‍රැකියා තත්ත්වය සම්බන්ධයෙන් සලකා බැලීමේ දී ඔවුන් අතරින් බහුතරයක් එනම්, 36 (9%) දෙනෙක් යකඩ පැස්සුම් සහයකයන් ලෙස සේවය කරනු ලබන අතර 11 (3%) දෙනෙක් පලංචි දැමීමෙහි නිරත වේ. ඊට අතිරේකව 7 (2%) දෙනෙක් විදුලි කාර්මික සහයකයින් ලෙස සේවයෙහි නිරත වේ.


නියැදිය තුළ නියෝජනය වූ නුපුහුණු ශ්‍රමිකයන් නිරතවී සිටින සේවා තත්ත්වයන් සළකා බැලීමේදී ඔවුන් අතරින් 43 (11%) දෙනෙක් කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමෙහි නිරත වන අතර 12 (3%) දෙනෙක් ද්‍රව්‍ය සැපයීමෙහි නිරත වේ. නුපුහුණු ශ්‍රමිකයින් අතරින් බහුතරයක් එනම්, 85 (21%) දෙනෙක් පිරිසිදුකරන්නන් ලෙස සේවය කරනු ලබයි.

නියැදියට ඇතුළත් කම්කරුවන්ගෙන් බහුතරයක් පුහුණු ශ්‍රමිකයන් ලෙස ‍රැකියාවෙහි නිරත වන බව ඉහත විශ්ලේෂිත තොරතුරු අනුව පැහැදිලි වේ.

### 2.1.10 මාසික ආදායම

නියැදිය තුළ නියෝජනය වූ කම්කරුවන්ගේ මාසික ආදායම සම්බන්ධයෙන් විමසා බැලීමේ දී බහුතරයකගේ මාසික ආදායම රු. 30,000 - 40,000 අතර බව අනාවරණය විය. එය මුළු නියැදියෙන් 171 (43%) කි. අසූ නව (22%) දෙනෙකුගේ ආදායම රු. 20,000 - 30,000 අතර විය . අසූ අට (22%) දෙනෙක් මාසික ආදායම රු. 40,000 - 50,000 අතර බව ප්‍රකාශ කර තිබුණි. විසි අට (7%) දෙනෙක් රු. 60,000 - 70,000 අතර මාසික ආදායමක් ලැබෙන බව ප්‍රකාශ කරන ලදි. පහළොස් (4%) දෙනෙකුගේ මාසික ආදායම රු. 50,000 -60,000 අතර විය . නව (2%) දෙනෙකුගේ මාසික ආදායම රු. 70,000 ට වැඩි බව ප්‍රකාශ කරන ලදි.

**ප්‍රස්තාර අංක 09 - මාසික ආදායම**




**මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**


### 2.2 ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සේවයෙහි නියුතු කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටාවන්

අධ්‍යයනය සඳහා තොරාගන්නා ලද ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම් අට තුළ කම්කරු සේවයෙහි නියුතු දැනට යම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන කම්කරුවන් අතරින් අහඹු ලෙස එක් වැඩබිමකින් කම්කරුවන් පනස් දෙනෙකු බැගින් වැඩබිම් අට තුළින් කම්කරුවන් 400 දෙනෙකු අධ්‍යයන නියැදියට තෝරාගනු ලැබූ අතර ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතචර්යාවේ ස්වභාවය හා මත්ද්‍රව්‍ය භාවිත පැතිකඩ සම්බන්ධයෙන් අධ්‍යයනය තුළ අවධානය යොමුකරන ලදි. ඒ අනුව ලද පර්යේෂණ අනාවරණයන් මෙම පරිච්ඡේදය තුළ ඉදිරිපත්කර ඇත.

## 2.3 ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ වයස් මට්ටම

අධ්‍යයන නියැදියට ඇතුළත් දත්ත දායකයින් ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති වයස් මට්ටම සලකා බැලීමේදී අධ්‍යයන අනාවරණයන්ට අනුව 95 (24%) දෙනෙක් වයස අවුරුදු 10 - 15 ත් අතර වයස් මට්ටමකදී ද, 32 (8%) දෙනෙක් වයස අවුරුදු 21 - 25 ත් වයස් මට්ටමකදී ද, 4 (1%) දෙනෙක් වයස අවුරුදු 30 වඩා වැඩි වයස් මට්ටමකදී ද, 3 (1%) දෙනෙක් වයස අවුරුදු 26 - 30 ත් අතර වයස් මට්ටමකදී ද ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇත. නියදියට ඇතුළත් බහුතර පුද්ගල සංඛ්‍යාවක් එනම්, 266 (66%) වයස අවුරුදු 16 - 20 ත් අතර වයස් මට්ටමකදී ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යක් භාවිත කර තිබුණි.

**ප්‍රස්තාර අංක 10 - ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිතයට යොමුවීමේ වයස් මට්ටම**





**මූලාශ්‍රයः (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

## 2.4 කම්කරුවන් විසින් කෙදිනක හෝ භාවිත කරන ලද මත්ද්‍රව්‍ය

අධ්‍යයන නියැදියට ඇතුළත් දත්තදායකයන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ අතීත තොරතුරු අධ්‍යයනය කිරීමේ දී ඔවුන් විසින් කෙදිනක හෝ භාවිත කරන ලද මත්ද්‍රව්‍යයන් මොනවාද යන්න අධ්‍යයනය තුළින් අනාවරණය කරගත හැකි විය. ඒ අනුව බහුතරයක් එනම්, පුද්ගලයින් 396 (99%) දෙනෙක් සිගරට් / දුම්වැටි කෙදිනක හෝ භාවිත කර තිබිණ. තුන්සිය හැට හය (92%) දෙනෙක් නීත්‍යානුකූල මද්‍යසාර කෙදිනක හෝ භාවිත කර තිබූ අතර 347 (87%) දෙනෙක් කේරළ ගංජා කෙදිනක හෝ භාවිත කර තිබුණි. කෙදිනක හෝ දේශීය ගංජා භාවිත කළ පුද්ගල සංඛ්‍යාව 167 (42%) දෙනෙක් වූ අතර නීතිවිරෝධී මද්‍යසාර (කසිප්පු) කෙදිනක හෝ භාවිත කළ පුද්ගල සංඛ්‍යාව 146 (37%) ක් විය. මනෝවර්ධක ඖෂධ 146 (37%) දෙනෙක් ද ,දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන 144 (36%) දෙනෙක් ද හෙරොයින් 125 (31%) දෙනෙක් ද සිරප් වර්ග 50 (13%) දෙනෙක් ද කෙදිනක හෝ භාවිත කර තිබුණි. එල් . එස් .ඩී ,කොකේන් වැනි මත්ද්‍රව්‍යද නියැදියට ඇතුළත් පුද්ගලයින් කෙදිනක හෝ භාවිත කර තිබූ අතර එම පුද්ගල සංඛ්‍යාව පිළිවෙළින් 4 (1%) දෙනෙක් සහ 3 (1%) දෙනෙක් විය. ඊට අමතරව 95 (24%) දෙනෙක් මදනමෝදක, හෂිස්, මෙතම්පිටමින් සහ හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් කෙදිනක හෝ භාවිත කර තිබුණි. ඒ අතරින් බහුතර පුද්ගල සංඛ්‍යාවක් එනම්, 90 (94%) දෙනෙක් හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් භාවිත කර තිබුණි.

**ප්‍රස්තාර අංක 11 - කම්කරුවන් විසින් කෙදිනක හෝ භාවිත කරන ලද මත්ද්‍රව්‍ය**





**මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

## 2.5 ප්‍රථමවරට මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමුවීම කෙරෙහි බලපාන ලද සාධක

ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යක් භාවිත කිරීම කෙරෙහි කම්කරුවන්හට බලපාන ලද සාධක පිළිබඳව ද අධ්‍යයනයේදී විමර්ශනය කරන ලදි. එහිදී අනාවරණය වූයේ බහුතර පිරිසක් එනම්,128 (32%) කුතුහලය නිසා ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යක් භාවිත කර ඇත. මිතුරු ඇසුර ද කම්කරුවන්ගේ ප්‍රථම මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි බලපා ඇති අතර එම පුද්ගල සංඛ්‍යාව 162 (41%) කි. පුද්ගලයින් 64 (16%) දෙනෙක් සතුට / විනෝදය සඳහා ද, 35 (9%) දෙනෙක් ගැටලු මඟහරවාගැනීම සඳහා ද, 5 (1%) ලිංගික තෘප්තිය සඳහා ද ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යක් භාවිත කර ඇත. අත්හදා බැලීම, ආශාව, ආතතිය, වැඩකරද්දී මහන්සිය නැතිවීමට සහ තනිකම යනාදී වෙනත් හේතූන් ද කම්කරුවන්ගේ ප්‍රථම මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි බලපා ඇත. එම පුද්ගල සංඛ්‍යාව 6 (1%) කි.

**ප්‍රස්තාර අංක 12 - ප්‍රථමවරට මත්ද්‍රව්‍ය භාවිතය සඳහා යොමුවීම කෙරෙහි බලපාන ලද සාධක**





**මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

## 2.6 ප්‍රථමවරට මත්ද්‍රව්‍ය භාවිත කළ අවස්ථාව

නියැදිය තුළ වූ කම්කරුවන් ප්‍රථමවරට මත්ද්‍රව්‍ය භාවිත කළ අවස්ථාව සලකා බැලීමේ දී බහුතර කම්කරුවන් පිරිසක් එනම්, 317 (79%) දෙනෙක් මිතුරන් සමඟ එකතු වූ අවස්ථාවක ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිත කර තිබුණි. 39 (10%) දෙනෙක් උත්සව අවස්ථාවකදී ද 11 (3%) දෙනෙක් ලිංගික සංසර්ගයේ යෙදෙන අවස්ථාවකදී ප්‍රථමවරට මත්ද්‍රව්‍ය භාවිත කර තිබුණි. නව (2%) දෙනා බැගින් සේවා ස්ථානයේදී සහ තනි වූ අවස්ථාවකදී ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිත කර තිබූ අතර 6 (2%) දෙනෙක් ගැටලුවක් වූ අවසථාවකදී ප්‍රථම වරට මත්ද්‍රව්‍ය භාවිත කර තිබුණි. වෙනත් අවස්ථාවන්හි දී එනම්, විනෝදගමනක් ගිය අවස්ථාවක දී සහ නෑදෑ නිවසකදී ප්‍රථමවරට මත්ද්‍රව්‍ය භාවිත කර ඇති පුද්ගල සංඛ්‍යාව 9 (2%) ක් විය.

**ප්‍රස්තාර අංක 13 - ප්‍රථමවරට මත්ද්‍රව්‍ය භාවිත කළ අවස්ථාව**





**මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

## 2.7 ප්‍රථම වරට මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම

ඉහත සඳහන් කරන ලද අවස්ථාවන්හි දී කම්කරුවන් හට යම් මත්ද්‍රව්‍යක් ප්‍රථමයෙන් හඳුන්වා දෙනු ලැබුවේ කා විසින් ද යන්න මෙම අධ්‍යයනයේ දී විමසා බලන ලදි. අධ්‍යයන අනාවරණයන්ට අනුව කම්කරුවන් බහුතරයකට එනම්, 266 (66%) දෙනෙකුට ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යක් හඳුන්වා දී ඇත්තේ තම සමීපතම මිතුරෙකු හෝ මිතුරියක විසිනි. තමන් විසින් යම් මත්ද්‍රව්‍යක් ප්‍රථම වරට භාවිත කළ පිරිස 57 (14%) ක් වූ අතර ඥාතියෙකු විසින් ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යක් හඳුන්වා දී ඇති කම්කරුවන් සංඛ්‍යාව 47 (12%) ක් විය. මත්ද්‍රව්‍ය වෙළෙන්දෙකු විසින් කම්කරුවන් 16 (4%) දෙනෙකුට ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යයක් හඳුන්වා දී ඇති අතර තමා සේවයෙහි නියුතු වූ වැඩබිමෙහි දී කම්කරුවන් 11 (3%) දෙනෙකුට එම වැඩබිමෙහි සේවයෙහි නියුතු වූ මිතුරෙකු විසින් ප්‍රථම වරට මත්ද්‍රව්‍යයක් හඳුන්වා දී ඇත. සේවායෝජක සහ රියදුරු සහයක මඟින් ද ප්‍රථම වරට මත්ද්‍රව්‍යක් හඳුනාගත් කම්කරුවන් ද නියැදිය තුළ නියෝජනය වූ අතර එම කම්කරුවන් සංඛ්‍යාව 3 (1%) ක් විය.

**ප්‍රස්තාර අංක 14 - ප්‍රථම වරට මත්ද්‍රව්‍ය හඳුනා ගැනීම**





**මූලාශ්‍රය : (ක්ෂෙත්‍ර අධ්‍යයනය, 2018)**

තමා සේවයෙහි නියුතු වූ වැඩ බිමෙහි සේවය කළ මිතුරෙකු විසින් ප්‍රථම වරට යම් මත්ද්‍රව්‍යයක් හඳුන්වා දී තිබීම ඉහත විශ්ලේෂණය තුළ හඳුනාගත හැකි සුවිශේෂී කාරණයක් වේ. ඒ අනුව වැඩ බිම්වල සේවයට පැමිණීමත් සමඟ ඇතැම් කම්කරුවන් කුමන හෝ මත්ද්‍රව්‍යයක් භාවිතය ආරම්භ කර ඇති බව තහවුරු වේ.

## 2.8 කම්කරුවන් විසින් පසුගිය වසර තුළ භාවිත කරන ලද මත්ද්‍රව්‍ය

අධ්‍යයන අනාවරණයන්ට අනුව සමස්ත දත්ත දායකයින් අතරින් බහුතර පුද්ගල සංඛ්‍යාවක් එනම්, 396 (99%) ක් පසුගිය වසර තුළ සිගරට් හෝ දුම්වැටි භාවිත කර තිබුණි. තුන්සිය හතලිස් හයක් (87%) නීත්‍යානුකූල මද්‍යසාර ද, 331 (83%) ක් කේරළ ගංජා ද, 146 (37%) ක් දේශීය ගංජා ද පසුගිය වසර තුළ භාවිත කර තිබූ අතර දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන 106 (27%) ක් පසුගිය වසර තුළ භාවිත කර භාවිත කර තිබිණ. මත් පෙති , හෙරොයින් , නීති විරෝධි මද්‍යසාර (කසිප්පු) , සිරප් වර්ග පසුගිය වසර තුළ භාවිත කළ පුද්ගල සංඛ්‍යාව පිළිවෙළින් 99 (25%), 69 ( 17%), 50 (13%) සහ 11 (3%) ක් විය. පසුගිය වසර තුළ කොකේන් සහ එල්.එස්.ඩී (LSD) භාවිත කළ පුද්ගලයින් ද එක් අයෙක් බැගින් විය. පසුගිය වසර තුළ මදනමෝදක සහ හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් භාවිත කර තිබූ පුද්ගලයින් 86 (22%) දෙනෙක් ද වූ අතර එයින් බහුතරයක් එනම්, 85 (99%) දෙනෙක් හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් භාවිත කර තිබූ පුද්ගලයින් විය.

ප්‍රස්තාර අංක 15 - කම්කරුවන් විසින් පසුගිය වසර තුළ භාවිත කරන ලද මත්ද්‍රව්‍ය





**මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

පසුගිය වසර තුළ කම්කරුවන් විසින් භාවිත කරන ලද මත්ද්‍රව්‍ය පිළිබඳ ඉහත විශ්ලේෂිත කරුණු අනුව ඉහළම ප්‍රචලිත බවක් තිබූ මත්ද්‍රව්‍ය සිගරට් හෝ දුම්වැටි බව පැහැදිලි වේ. පසුගිය වසර තුළ නීත්‍යානුකුල මද්‍යසාර, කේරළ ගංජා, දේශීය ගංජා සහ දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන භාවිතය අනෙකුත් මත්ද්‍රව්‍ය භාවිතයට වඩා ඉහළ ප්‍රචලිත බවක් පැවත ඇති බව තවදුරටත් පැහැදිලි වේ. අඩුම ප්‍රචලිත බව කොකේන් සහ එල්.එස්.ඩී (LSD) භාවිතය සම්බන්ධයෙන් හඳුනාගත හැකිය.

## 2.9 කම්කරුවන් විසින් පසුගිය තෙමස තුළ භාවිත කරන ලද මත්ද්‍රව්‍ය

නියැදියට ඇතුළත් දත්ත දායකයින්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටාව පිළිබඳ අධ්‍යයනය කිරීමේදී පසුගිය තෙමස තුළ ඔවුන් භාවිත කරන ලද මත්ද්‍රව්‍යයන් මොනවාද යන්නත් අනාවරණය විය. ඒ අනුව 328 (82%) දෙනෙක් නීත්‍යානුකුල මද්‍යසාර භාවිත කර තිබූ අතර 318 (18%) දෙනෙක් කේරළ ගංජා භාවිත කර තිබිණ. දේශීය ගංජා , දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන, පෙති වර්ග, නීති විරෝධි මද්‍යසාර , හෙරොයින් සහ සිරප් වර්ග භාවිත කළ පුද්ගල සංඛ්‍යාව පිළිවෙළින් 133 (33%), 95 (24%), 76 (19%), 30 (8%), 41 (10%) සහ 4 (1%) දෙනෙක් විය. කොකේන් සහ එල්. එස්. ඩි (LSD) භාවිත කළ පුද්ගලයින් එක් අයෙකු බැගින් වූ අතර බහුතර පුද්ගල සංඛ්‍යාවක් එනම්, 395 (99%) දෙනෙක් සිගරට් හෝ දුම්වැටි භාවිත කර තිබිණ. ඊට අමතරව 85 (21%) දෙනෙක් හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් භාවිත කර තිබිණ.

**ප්‍රස්තාර අංක 16 - කම්කරුවන් විසින් පසුගිය තෙමස තුළ භාවිත කරන ලද මත්ද්‍රව්‍ය**





**මූලාශ්‍රයː (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

## 2.10කම්කරුවන් විසින් දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය වර්ග

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ කම්කරුවන් දැනට භාවිත කරනු ලබන එක් එක් මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් අවධානය යොමුකිරීමේ දී  කම්කරුවන් 314 (79%) දෙනෙක් කේරල ගංජා දැනට භාවිත කරනු ලබන අතර 305 (76%) දෙනෙක් නීත්‍යානුකූල මද්‍යසාර  භාවිත කරනු ලබයි. එකසිය විසි දෙනෙක් (30%) දේශීය ගංජා ද, 82 (21%) දෙනෙක් දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන ද දැනට භාවිත කරන බවට අධ්‍යයන තුළින් අනාවරණය විය. පෙති වර්ග සහ හෙරොයින් දැනට භාවිත කරන කම්කරුවන් සංඛ්‍යාව පිළිවෙළින් 65 (16%) දෙනෙක් සහ 36 (9%) දෙනෙක් විය. ඊට අතිරේකව එල්.එස්.ඩී (LSD)සහ සිරප් වර්ග දැනට භාවිත කරන කම්කරුවන් එක් අයෙකු බැගින් ද නියැදිය තුළ විය. අසූ එක් දෙනෙක් (20%) හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් භාවිත කරන බවට අධ්‍යයනය තුළින් අනාවරණය විය. නියැදියට ඇතුළත් දත්ත දායකයින්ගෙන් බහුතරයක් කම්කරුවන් එනම්, 395 (99%) දෙනෙක් සිගරට්/දුම්වැටි භාවිත කරන බවට අධ්‍යයනය තුළින් තවදුරටත් අනාවරණය විය.

**ප්‍රස්තාර අංක 17 - කම්කරුවන් විසින් දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය වර්ග**




**මූලාශ්‍රයː (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

නියැදියට ඇතුළත් සියලු කම්කරුවන්ගේ දැනට භාවිත කරන  මත්ද්‍රව්‍ය විශ්ලේෂණය කර බැලීමේ දී පැහැදිලි වන ප්‍රධාන කාරණය නම් කම්කරුවන් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරනු ලබන බවයි. එමෙන්ම

සිගරට් / දුම්වැටි භාවිතය සම්බන්ධයෙන් ඉහළම ප්‍රචලිත බවක් හඳුනාගත හැකිය. නීත්‍යානුකූල මද්‍යසාර , දේශීය ගංජා , කේරළ ගංජා, දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන, මත්පෙති සහ හෙරොයින් ද කම්කරුවන් අතර ප්‍රචලිතව පවතින මත්ද්‍රව්‍ය ලෙස හඳුනාගත හැකිය. පෙර සඳහන් කරන ලද මත්ද්‍රව්‍යයන්ට සාපේක්ෂව එල්.එස්.ඩී (LSD) සහ සිරප් වර්ග භාවිතයෙහි අඩු ප්‍රචලිත බවක් පවතින බව ද හඳුනාගත හැකිය.

## 2.11 කම්කරුවන්ගේ සිගරට්/දුම්වැටි සහ මද්‍යසාර ආශ්‍රිත ප්‍රවණතා

### 2.11.1 සිගරට්/දුම්වැටි භාවිතය

කම්කරුවන්ගේ සිගරට්/දුම්වැටි භාවිතය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී නියැදිය තුළ නියෝජනය වූ කම්කරුවන් 395 (99%) දෙනෙක් දැනට සිගරට්/දුම්වැටි භාවිත කරන අතර එයින් 373 (94%) දෙනෙක් දිනපතා සිගරට්/දුම්වැටි භාවිත කරයි. විසි එක් දෙනෙක් (5%) ඉඳහිට සිගරට්/දුම්වැටි භාවිත කරනු ලබන අතර එක් අයෙකු (0.25%) කලාතුරකින් සිගරට්/දුම්වැටි භාවිත කරනු ලබයි.

ඉහත විශ්ලේෂිත කරුණු දෙස සලකා බැලීමේ දී පැහැදිලි වන්නේ, දැනට සිගරට්/දුම්වැටි භාවිත කරන කම්කරුවන් අතරින් බහුතරයක් දෙනා දිනපතා සිගරට්/දුම්වැටි භාවිත කිරීමට යොමු වී සිටින බවයි. ඒ අනුව කම්කරුවන් අතර සිගරට්/දුම්වැටි භාවිත කිරීමේ ඉහළ ප්‍රවණතාවක් පවතින බව තහවුරු වේ.

### 2.11.2 මද්‍යසාර භාවිතය

අධ්‍යයනයට භාජනය කරන ලද කම්කරුවන්ගේ මද්‍යසාර භාවිතය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී නියැදිය තුළ වූ කම්කරුවන් දැනට නීත්‍යානුකූල මද්‍යසාර සහ නීතිවිරෝධී මද්‍යසාර (කසිප්පු) භාවිත කරන බවට තොරතුරු අනාවරණය විය. අධ්‍යයනයට භාජනය කරන ලද කම්කරුවන්ගෙන් 305 (76%) දෙනෙක් දැනට නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කරන්නන් වූ අතර 17 (4%) දෙනෙක් දැනට නීතිවිරෝධී මද්‍යසාර භාවිත කරන්නන් විය.

නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කරන කම්කරුවන් 305 (76%) දෙනා අතරින් 40 (13%) දෙනෙක් දිනපතා නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කරන්නන් වූ අතර 56 (18%) දෙනෙක් කලාතුරකින් නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කරන්නන් විය. ඊට අතිරේකව 30 (10%) දෙනෙක් විශේෂිත අවස්ථාවන්හිදී පමණක් නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කරන්නන් විය. දැනට නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කරන කම්කරුවන් අතරින් බහුතරයක් එනම්, 179 (59%) දෙනෙක් ඉඳහිට නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කරන්නන් විය.


කම්කරුවන්ගේ නීතිවිරෝධී මද්‍යසාර භාවිතය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී දැනට නීතිවිරෝධී මද්‍යසාර භාවිත කරන කම්කරුවන් 17 (4%) දෙනා අතරින් 11 (65%) දෙනෙක් ඉඳහිට නීතිවිරෝධී මද්‍යසාර භාවිත කරන කම්කරුවන් වූ අතර 6 (35%) දෙනෙක් කලාතුරකින් නීතිවිරෝධී මද්‍යසාර භාවිත කරන්නන් විය. දැනට නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කරන කම්කරුවන් අතර දිනපතා නීත්‍යානුකූල මද්‍යසාර භාවිත කරන කිසිවෙකු නොසිටීම, කම්කරුවන්ගේ නීතිවිරෝධී මද්‍යසාර භාවිතය සම්බන්ධයෙන් අනාවරණය වූ එක් විශේෂිත කරුණකි.

## 2.12 කම්කරුවන්ගේ ගංජා භාවිතය ආශ්‍රිත ප්‍රවණතා සහ රටා

අධ්‍යයන නියැදියට ඇතුළත් වූ කම්කරුවන්ගෙන් 314 (79%) දෙනෙක් කේරළ ගංජා දැනට භාවිත කරන්නන් වූ අතර 120 (30%) දෙනෙක් දැනට දේශීය ගංජා භාවිත කරන්නන් විය. ඔවුන් සියලු දෙනාම දුමක් ලෙස එය භාවිත කරන බවට තොරතුරු අනාවරණය විය.

කේරළ ගංජා භාවිත කරන කම්කරුවන් 314 (79%) දෙනා අතුරින් 171 (54%) දෙනෙක් වැනි බහුතර කම්කරු පිරිසක් දිනපතා කේරළ ගංජා භාවිත කරනු ලබන අතර 118 (38%) දෙනෙක් ඉඳහිට කේරළ ගංජා භාවිත කරනු ලබයි. ඊට අමතරව 22 (7%) දෙනෙක් කලාතුරකින් කේරළ ගංජා භාවිත කරනු ලබන අතර 3 (1%) දෙනෙක් විශේෂිත අවස්ථාවන්හි දී පමණක් කේරළ ගංජා භාවිත කරනු ලබයි.

**ප්‍රස්තාර අංක 18 - කම්කරුවන්ගේ කේරළ ගංජා භාවිතය**





**මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

කම්කරුවන් අතර කේරල ගංජා දිනපතා භාවිත කිරීම සම්බන්ධයෙන් ඉහළ ප්‍රවණතාවක් පවතින බව ඉහත විශ්ලේෂිත කරුණු අනුව තහවුරු වේ.

අධ්‍යයනයට භාජනය කරන ලද නියැදිය තුළ නියෝජනය වූ දැනට කේරල ගංජා භාවිත කරන කම්කරුවන් සිය අවශ්‍යතාවය සඳහා කේරළ ගංජා සපයා ගන්නා ආකාරය පිළිබඳව විමසීමේදී, බහුතරයක් එනම්, 138 (44%) දෙනෙක් සේවා ස්ථානයේ මිතුරෙකුගෙන් ද 129 (41%) දෙනෙක් පෞද්ගලිකව හඳුනන අලෙවිකරුවෙකුගෙන් ද 84 (27%) දෙනෙක් සේවා ස්ථානයේ නොවන වෙනත් මිතුරෙකුගෙන් ද 26 (8%) දෙනෙක් පෞද්ගලිකව නොහඳුනන අලෙවිකරුවෙකුගෙන් ද සපයාගන්නා බවට ප්‍රතිචාර දක්වා තිබිණ.

**ප්‍රස්තාර අංක 19 - කම්කරුවන් සිය අවශ්‍යතාවය සඳහා කේරළ ගංජා සපයා ගන්නා ආකාරය**





**මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

කම්කරුවන්ගේ කේරළ ගංජා සපයාගැනීම සම්බන්ධ විශ්ලේෂිත කරුණු අනුව පැහැදිලි වන්නේ, සේවා ස්ථානය තුළ වූ මිතුරන්ගෙන් කේරළ ගංජා සපයාගැනීමේ ඉහළ ප්‍රවණතාවයක් පවතින බවයි.

දේශීය ගංජා දැනට භාවිත කරන කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිත රටා පිළිබඳ අවධානය යොමු කිරීමේ දී දැනට දේශීය ගංජා භාවිත කරන කම්කරුවන් 120 (30%) දෙනා අතරින් බහුතරයක් එනම්, 57 (48%) දෙනෙක් ඉඳහිට දේශීය ගංජා භාවිත කරන අතර 38 (32%) දෙනෙක් දිනපතා දේශීය ගංජා භාවිත කරයි. ඊට අමතරව 22 (18%) දෙනෙක් කලාතුරකින් දේශීය ගංජා භාවිත කරන අතර 3 (3%) දෙනෙක් විශේෂිත අවස්ථාවන්හි දී පමණක් දේශීය ගංජා භාවිත කරනු ලබයි.


**ප්‍රස්තාර අංක 20 - කම්කරුවන්ගේ දේශීය ගංජා භාවිතය**




**මූලාශ්‍රයः (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

සිය භාවිතය සඳහා කම්කරුවන් දේශීය ගංජා සපයා ගන්නා ආකාරය සලකා බැලීමේ දී අධ්‍යයන අනාවරණයන්ට අනුව බහුතරයක් එනම්, 94 (78%) දෙනෙක් පෞද්ගලිකව හඳුනන අලෙවිකරුවෙකුගෙන් දේශීය ගංජා සපයාගන්නා අතර 31 (26%) දෙනෙක් සේවා ස්ථානයේ මිතුරෙකුගෙන් ද, 23 (19%) දෙනෙක් සේවා ස්ථානයේ නොවන වෙනත් මිතුරෙකුගෙන් ද, 7(6%) දෙනෙක් පෞද්ගලිකව නොහඳුනන අලෙවිකරුවෙකුගෙන් ද දේශීය ගංජා සපයාගනී.

**ප්‍රස්තාර අංක 21 - කම්කරුවන් සිය අවශ්‍යතාවය සඳහා දේශීය ගංජා සපයා ගන්නා ආකාරය**





**මූලාශ්‍රයः (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

## 2.13 කම්කරුවන්ගේ හෙරොයින් භාවිත ප්‍රවණතා සහ රටා

හෙරොයින් භාවිත කරන කම්කරුවන්ගේ හෙරොයින් භාවිත රටා පිළිබඳ අවධානය යොමු කිරීමේ දී දැනට හෙරොයින් භාවිත කරන කම්කරුවන් 36 (9%) දෙනා අතුරින් 10 (28%) දෙනෙක් දිනපතා හෙරොයින් භාවිත කරනු ලබන අතර 7 (19%) දෙනෙක් කලාතුරකින් හෙරොයින් භාවිත කරනු ලබයි. ඊට අමතරව දෙදෙනෙක් (6%) විශේෂිත අවස්ථාවන්හි දී හෙරොයින් භාවිත කරනු ලබයි. හෙරොයින් දැනට භාවිත කරනු ලබන කම්කරුවන් අතුරින් බහුතර පිරිසක් එනම්, 17 (47%) දෙනෙක් ඉඳහිට හෙරොයින් භාවිත කරනු ලබන බව අධ්‍යයනය තුළින් තවදුරටත් අනාවරණය විය.

**ප්‍රස්තාර අංක 22 - කම්කරුවන්ගේ හෙරොයින් භාවිතය**





**මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

කම්කරුවන්ගේ හෙරොයින් භාවිතය හා සම්බන්ධ ප්‍රවණතා අධ්‍යයනයෙහි දී ඔවුන් හෙරොයින් භාවිත කිරීමට අනුගමනය කරන ක්‍රම පිළිබඳව ද අවධානය යොමුකරන ලදි. ඒ අනුව දැනට හෙරොයින් භාවිත කරන කම්කරුවන් 36 (9%) දෙනාගෙන් 33 (92%) දෙනෙක් චයිනිස් ක්‍රමය (Chases The Dragon) භාවිත කරන බවත් 3 (8%) දෙනෙක් ඉරීම / ආඝ්‍රහණය කිරීම මඟින් හෙරොයින් ශරීරගත කර ගන්නා බවත් අනාවරණය විය. දැනට හෙරොයින් භාවිත කරන කම්කරුවන්ගෙන් එක් අයෙකු පමණක් හෙරොයින් එන්නත් කරගන්නා බව අධ්‍යයනය තුළින් අනාවරණය විය.

දැනට හෙරොයින් භාවිත කරන කම්කරුවන් සිය භාවිතය සඳහා හෙරොයින් සපයාගන්නා ආකාරය පිළිබඳව සලකා බැලීමේ දී කම්කරුවන් 6 (17%) දෙනෙක් සේවා ස්ථානයේ නොවන වෙනත් මිතුරෙකුගෙන් ද 4 (11%) දෙනෙකු බැගින් සේවා ස්ථානයේ මිතුරෙකුගෙන් සහ පෞද්ගලිකව නොහඳුනන අලෙවිකරුවෙකුගෙන් ද හෙරොයින් සපයාගන්නා බව අනාවරණය විය. දැනට හෙරොයින් භාවිත කරන කම්කරුවන් අතරින් 26 (72%) දෙනෙක් වැනි බහුතර පිරිසක් පෞද්ගලිකව හඳුනන අලෙවිකරුවෙකුගෙන් හෙරොයින් සපයාගන්නා බවට තොරතුරු අනාවරණය වූ අතර නියැදිය තුළ නියෝජනය වූ එක් කාන්තාවක් තම අනියම් සැමියාගෙන් හෙරොයින් සපයාගන්නා බවට තවදුරටත් අධ්‍යයනය මඟින් තොරතුරු අනාවරණය විය.

**ප්‍රස්තාර අංක 23 - කම්කරුවන් සිය අවශ්‍යතාවය සඳහා හෙරොයින් සපයා ගන්නා ආකාරය**




**මූලාශ්‍රයː (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

## 2.14 කම්කරුවන් අතර ඖෂධ (පෙති වර්ග/ සිරප් වර්ග) අවභාවිතය සහ ඒ ආශ්‍රිත ප්‍රවණතා

නියැදිය තුළ නියෝජනය වූ කම්කරුවන් අතුරින් 65 (16%) දෙනෙක් ඖෂධ (පෙති වර්ග) දැනට භාවිත කරයි. ඒ අතුරින් 27 (42%) දෙනෙක් ඉදහිට පෙතිවර්ග භාවිත කරන අතර 19 (29%) දෙනෙක් කලාතුරකින් පෙති වර්ග භාවිත කරයි. දිනපතා ඖෂධ (පෙතිවර්ග) අවභාවිත කරන කම්කරුවන් ද ඖෂධ (පෙතිවර්ග) අවභාවිත කරන පිරිස තුළ වූ අතර එම කම්කරුවන් සංඛ්‍යාව 17 (26%) දෙනෙකි.

කම්කරුවන් අතර සිරප් වර්ග අවභාවිතය පිළිබඳ සලකා බැලීමේ දී නියැදිය තුළ වූ කම්කරුවන්ගෙන් එක් අයෙකු පමණක් දැනට සිරප් වර්ග භාවිත කරන බවට අධ්‍යයනය තුළින් තොරතුරු අනාවරණය විය.

දැනට පෙති වර්ග අවභාවිත කරන කම්කරුවන්ගේ ඖෂධ (පෙති වර්ග) අවභාවිත කරන ක්‍රමය සළකා බැලීමේ දී අනාවරණය වූයේ, ඔවුන් අතුරින් එක් අයෙකු පමණක් මෝර්ෆීන් සල්ෆේට් නැමති පෙති වර්ගය එන්නත් කරගන්නා බවත් සෙසු පුද්ගලයින් පෙති වර්ග පානය කරන බවත්ය.

දැනට ඖෂධ (පෙති වර්ග) භාවිත කරන කම්කරුවන්ගේ ඖෂධ (පෙති වර්ග) සපයාගැනීම සම්බන්ධව අනාවරණය වූ තොරතුරු අනුව දැනට ඖෂධ (පෙති වර්ග) භාවිත කරන කම්කරුවන්ගෙන් බහුතරයක් එනම්, 43 (66%) දෙනෙක් පෞද්ගලික ඖෂධහල්වලින් ඖෂධ (පෙති වර්ග) ලබාගනී. ඔවුන් පෞද්ගලික ඖෂධහල්වලින් ඖෂධ (පෙති වර්ග) නීත්‍යානුකූල නොවන ආකාරයට ලබාගන්නා අතර ඖෂධහල් හිමියා සමග තිබෙන පෞද්ගලික දැන හැඳුනුම්කම් මත හෝ ව්‍යාජ වෛද්‍ය නිර්දේශ භාවිත කිරීම මත එම ඖෂධ (පෙති වර්ග) ලබාගැනීම සිදුකරනු ලබයි. ඖෂධහල්වලින් නීත්‍යානුකුල නොවන ආකාරයට ඖෂධ (පෙති වර්ග) ලබාගැනීමට අමතරව 11 (17%) දෙනෙක් පෞද්ගලිකව හඳුනන අලෙවිකරුවකුගෙන් ද 8 (12%) දෙනෙක් පෞද්ගලිකව නොහඳුනන අලෙවිකරුවකුගෙන් ද 6 (9%) දෙනෙක් සේවා ස්ථානයේ නොවන වෙනත් මිතුරකුගෙන් ද එක් කම්කරුවකු පමණක් (2%) සේවා ස්ථානයේ මිතුරකුගෙන් ද ඖෂධ (පෙති වර්ග) ලබා ගන්නා බව අනාවරණය විය.

## 2.15 කම්කරුවන් අතර දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන සහ එල්.එස්.ඩී භාවිතය හා ඒ අශ්‍රිත ප්‍රවණතා


අධ්‍යයනයට භාජනය කරන ලද නියැදිය තුළ දැනට දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන භාවිත කරන කම්කරුවන් ද සිටි අතර එම කම්කරුවන් 82 (21%) දෙනා අතුරින් 47 (57%) දෙනෙක් දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන ඉදහිට භාවිත කරන්නන් විය. තිස් තුන් දෙනෙක් (40%) දිනපතා දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන භාවිත කරන්නන් වූ අතර දෙදෙනෙක් (2%) කලාතුරකින් දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන භාවිත කරන්නන් විය.

එල්.එස්.ඩී දැනට භාවිත කරන එක් කම්කරුවෙක් පමණක් අධ්‍යයන නියැදිය තුළ වූ අතර එම පුද්ගලයා ද කලාතුරකින් පමණක් එල්.එස්.ඩී භාවිත කරන බවට තොරතුරු අනාවරණය විය.

## 2.16 කම්කරුවන් මත්ද්‍රව්‍ය සඳහා දිනකට වැය කරන මුදල් ප්‍රමාණය

කම්කරුවන් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා දිනකට වැය කරන මුදල් ප්‍රමාණය පිළිබඳව විමර්ශනය කිරීමේ දී නියදියට අයත් සියලු කම්කරුවන්ගෙන් බහුතර පිරිසක් එනම්, 122 (30%) දෙනෙක් රු. 501 - 750 ත් අතර මුදලක් වැය කරන බවට තොරතුරු අනාවරණය වූ අතර 111 (28%) දෙනෙක් රු. 251 - 500 ත් අතර මුදලක් ද 89 (22%) දෙනෙක් රු. 751 -1000 ත් අතර මුදලක් ද වැය කරන බවට තොරතුරු අනාවරණය විය. ඊට අතිරේකව රු. 100 - 250 ත් අතර මුදලක් හා රු. 1001 - 2000 ත් අතර මුදලක් භාවිත කරන කම්කරුවන් 39 (10%) දෙනා බැගින් විය.

**ප්‍රස්තාර අංක 24 - කම්කරුවන් මත්ද්‍රව්‍ය භාවිතය සඳහා දිනකට වැය කරන මුදල් ප්‍රමාණය**





**මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

## 2.17 මත්ද්‍රව්‍ය භාවිතය සඳහා කම්කරුවන් මුදල් උපයාගන්නා ආකාරය

අධ්‍යයනය තුළ නියෝජනය වූ කම්කරුවන් තම මත්ද්‍රව්‍ය භාවිතය සඳහා අවශ්‍ය මුදල් සපයාගන්නේ කෙසේ ද යන්න පිළිබඳව ද අධ්‍යයනය තුළදී අවධානය යොමු කරන ලදි. ඒ අනුව නියදියට ඇතුළත් වූ සියලුම කම්කරුවන් තම ප්‍රධාන රැකියාව වන කම්කරු සේවයෙහි නිරතවීමෙන් උපයාගන්නා මුදල්වලින් ද මත්ද්‍රව්‍ය මිලදී ගන්නා බවට කරුණු අනාවරණය විය. සමස්ත නියැදිය තුළ වූ කම්කරුවන්ගෙන් 58 (15%) දෙනෙක් තම ප්‍රධාන රැකියාවට අමතරව වෙනත් සුළු රැකියාවක නිරත වීමෙන් මත්ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මුදල් සපයාගන්නා බවට තොරතුරු අනාවරණය විය. 38 (10%) දෙනෙක් වෙනත් පුද්ගලයෙකුගෙන් ණයට මුදල් ලබාගැනීම සිදුකරන බවට ප්‍රකාශ කර තිබූ අතර 12 (3%) දෙනෙක් අතිකාල දීමනා සඳහා ලැබෙන මුදලින් මත්ද්‍රව්‍ය මිලදී ගන්නා බව ප්‍රකාශ කර තිබිණ.

සමස්ත නියදිය තුළ නියෝජනය වූ කාන්තාවන් 4 (1%) දෙනෙක් කම්කරු සේවයෙහි නියැලීමට අමතරව ගණිකා වෘත්තියෙහි නියැලී මත්ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මුදල් උපයාගන්නා බවට තොරතුරු අනාවරණය විය. ඇතැම් පුද්ගලයින් තම ප්‍රධාන රැකියාවට අමතරව සමාජ විරෝධී සහ නීති විරෝධී ක්‍රියා සිදුකිරීම මඟින් ද මුදල් උපයාගනී. ඒ අනුව මත්ද්‍රව්‍ය අලෙවි කිරීම මඟින් කම්කරුවන් 14 (4%) දෙනෙක් මත්ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා මුදල් සපයාගනී. 12 (3%) දෙනෙක් තමා සේවය කරනු ලබන සේවා ස්ථානය තුළ තිබෙන සුළු උපකරණ සොරකම් කර අලෙවි කිරීම මඟින් එසේත් නැත්නම් සේවා ස්ථානයේ සේවයෙහි නියුතු පුද්ගලයින්ගෙන් හෝ බාහිර පුද්ගලයින්ගේ මුදල් පසුම්බි, අත්ඔරලෝසු හෝ ජංගම දුරකථන වැනි දෑ සොරකම් කර අලෙවි කිරීම මඟින් මුදල් සපයාගැනීම, තම ඥාතියෙකුගෙන් හෝ මිතුරෙකුගෙන් මුදල් සපයාගැනීම සිදුකරන බවට අධ්‍යයනය තුළින් තවදුරටත් තොරතුරු අනාවරණය විය.

**ප්‍රස්තාර අංක 25 - මත්ද්‍රව්‍ය භාවිතය සඳහා කම්කරුවන් මුදල් උපයාගන්නා ආකාරය**




**මූලාශ්‍රයː (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

## 2.18 ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම්වල ස්වභාවය හා කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය ආශ්‍රිත ප්‍රවණතා සහ පුද්ගල චර්යාවේ ස්වභාවය


### 2.18.1 සේවා ස්ථානය තුළ කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයේ ස්වාභාවය

අධ්‍යයන නියැදිය තුළ නියෝජනය වූ කම්කරුවන්ගෙන් 320 (80%) දෙනෙක් තමා සේවය කරනු ලබන සේවා ස්ථානය තුළ කෙදිනක හෝ යම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ඇති බවට ප්‍රතිචාර දක්වා තිබිණි. ඔවුන්ගෙන් 247 (77%) දෙනෙක් සේවා ස්ථානය තුළ දිනපතා මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් වූ අතර සෙසු කම්කරුවන් 73 (23%) දෙනා සේවා ස්ථානය තුළ දිනපතා මත්ද්‍රව්‍ය භාවිත නොකරන බවට ප්‍රතිචාර දක්වා තිබිණ.

සේවා ස්ථානය තුළ කෙදිනක හෝ යම් මත්ද්‍රව්‍ය භාවිත කළ බවට ප්‍රතිචාර දක්වන ලද කම්කරුවන් භාවිත කර ඇති මත්ද්‍රව්‍ය සම්බන්ධව අවධානය යොමු කිරීමේ දී අනාවරණය වූයේ ඔවුන්ගෙන් බහුතරයක් එනම්, 306 (96%) දෙනෙක් සිගරැට්/ දුම්වැටි භාවිත කර ඇති බවයි. එකසිය විසිහය දෙනෙක් (39%) පෙති වර්ග භාවිත කළ බවටත්, 75 (23%) දෙනක් කේරළ ගංජා භාවිතා කළ බවටත් තොරතුරු අනාවරණය විය. සේවා ස්ථානය තුළ දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන භාවිත කළ කම්කරුවන් 55 (17%) දෙනෙක් ද වූ අතර සිරප් වර්ග භාවිත කළ කම්කරුවන් 27 (8%) දෙනෙක් ද විය. ඊට අමතරව 21 (7%) දෙනෙක් දේශීය ගංජා භාවිත කර ඇති අතර 9 (3%) දෙනෙක් නීත්‍යානුකූල

මද්‍යසාර භාවිත කර ඇත. 45 (14%) දෙනෙක් හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් භාවිත කර ඇත.

**ප්‍රස්තාර අංක 26 - කම්කරුවන් සේවා ස්ථානය තුළ කෙදිනක හෝ භාවිත කර ඇති මත්ද්‍රව්‍ය**




**මූලාශ්‍රයః (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

ඉහත විශ්ලේෂිත කරුණු අනුව සේවා ස්ථානය තුළ යම් මත්ද්‍රව්‍යයක් භාවිත කළ කම්කරුවන් අතර ඉහළම ප්‍රචලිත බවක් සිගරට්/ දුම්වැටි සම්බන්ධයෙන් පවතින අතර පෙති වර්ග දෙවන ස්ථානයටත් කේරල ගංජා තෙවන ස්ථානයටත් ප්‍රචලිත බව තහවුරු වේ. එමෙන්ම සේවා ස්ථානය තුළ දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන, සිරප් වර්ග දේශීය ගංජා සහ නීත්‍යානුකූල මද්‍යසාර භාවිතය සම්බන්ධයෙන් ද යම් ප්‍රචලිත බවක් පවතින බව තහවුරු වේ. අන්තරායකර ඖෂධ සම්බන්ධයෙන් සැලකූ විට සෙසු මත්ද්‍රව්‍යයන්ට සාපේක්ෂව කේරළ ගංජා භාවිත කිරීමේ ඉහළ ප්‍රවණතාවක් ද පවතිව බව ඉහත විශ්ලේෂණය තුළින් පැහැදිලි වේ. මේ අනුව තහවුරු වන්නේ සේවා ස්ථාන තුළ කම්කරුවන් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කර ඇති බවයි.


සේවා ස්ථානය තුළ මත්ද්‍රව්‍ය භාවිත කළ කම්කරුවන් එම මත්ද්‍රව්‍ය භාවිත කරනු ලැබුවේ කවුරුන් සමඟ ද යන්න පිළිබඳව ද අධ්‍යයනය තුළදී අවධානය යොමු කරන ලද අතර තනිවම කම්කරුවන් 182 (57%) දෙනෙක් ද, ඥාතියෙකු සමඟ එක් කම්කරුවෙක් ද, සේවා ස්ථානයේ නොවන මිතුරන් සමඟ එක් කම්කරුවකු ද මත්ද්‍රව්‍ය භාවිත කළ බවට තොරතුරු අනාවරණය වූ අතර බහුතර කම්කරු පිරිසක් එනම් 210 (66%) දෙනෙක් සේවා ස්ථානයේ මිතුරන් සමඟ මත්ද්‍රව්‍ය භාවිත කළ බවට තොරතුරු අනාවරණය විය.

සේවා ස්ථානය තුළ මත්ද්‍රව්‍ය භාවිත කළ කම්කරුවන් එම මත්ද්‍රව්‍ය භාවිත කර ඇත්තේ කවුරුන් සමඟ ද යන්න සම්බන්ධයෙන් විශ්ලේෂිත කරුණු තුළින් තහවුරු වන්නේ කම්කරුවන් සේවා ස්ථානය තුළ මිතුරන් සමඟ මත්ද්‍රව්‍ය භාවිත කිරීමේ ඉහළ ප්‍රවණතාවයක් පවතින බවයි.

සේවා ස්ථානය තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන කම්කරුවන් මත්ද්‍රව්‍ය භාවිත කරන ස්ථාන පිළිබඳව අවධානය යොමු කිරීමේදී කම්කරුවන් බහුතරයක් එනම්, 139 (43%) දෙනෙක් වැසිකිළියේදී මත්ද්‍රව්‍ය භාවිත කළ බවට තොරතුරු අනාවරණය වූ අතර දුම්පානය සඳහා වෙන්කර ඇති ස්ථානයේදී 72 (23%) දෙනෙක් ද සේවා ස්ථානය තුළ තාවකාලිකව නවාතැන්ගෙන ඇති කාමරයේදී 55 (17%) දෙනෙක් ද, කිසිවෙකුත් නොගැවසෙන තැනකදී 54 (17%) දෙනෙක් ද, ආපන ශාලාවේදී 17 (5%) දෙනෙක් ද මත්ද්‍රව්‍ය භාවිත කළ බවට තොරතුරු අනාවරණය විය. විවේක ගන්නා ස්ථානයේ,

මුරකුටිය අසල සහ ආවරණය වූ ස්ථානයක මත්ද්‍රව්‍ය භාවිත කළ කම්කරුවන් සංඛ්‍යාව පිළිවෙළින් 7 (2%), 6 (2%) සහ 5 (2%) විය. කම්කරුවන් 3 (1%) දෙනා බැගින් ආහාර ගන්නා ස්ථානයේ දී සහ වාහනය තුළ දී මත්ද්‍රව්‍ය භාවිත කළ බවට තවදුරටත් තොරතුරු අනාවරණය විය.

**ප්‍රස්තාර අංක 27 - කම්කරුවන් සේවා ස්ථානය තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන ස්ථාන**




**මූලාශ්‍රයː (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

සේවා ස්ථානය තුළ මත්ද්‍රව්‍ය භාවිත කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කර ඇති බව මූලික තොරතුරු සපයන්නන්ගෙන් අනාවරණය වූ අතර ඒ හේතුව නිසාවෙන්ම කම්කරුවන් සේවා ස්ථානය තුළ මත්ද්‍රව්‍ය භාවිත කිරීම සිදුකරනු ලබන්නේ රහසිගත ස්ථානයන්හිදී බව ඉහත විශ්ලේෂිත කරුණු අනුව තහවුරු විය.

### 2.18.2 කම්කරුවන් මත්ද්‍රව්‍ය භාවිත කරන අවස්ථා

නියැදිය තුළ නියෝජනය වූ කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිත කරන අවස්ථාවන් සලකාබැලීමේ දී ඔවුන් පහත සඳහන් අවස්ථාවන්හි දී මත්ද්‍රව්‍ය භාවිත කරන බවට තොරතුරු අනාවරණය විය.

**වගු අංක 04 - කම්කරුවන් මත්ද්‍රව්‍ය භාවිත කරන අවස්ථා**

| මත්ද්‍රව්‍ය භාවිත කරන අවස්ථාව | සංඛ්‍යාව | % |
|---|---|---|
| සේවය ආරම්භ කිරීමට පෙර | 243 | 61 |
| සේවයෙහි නිරතව සිටින අතරතුර | 189 | 47 |
| විවේක කාලය අතරතුර | 343 | 86 |
| සේවය නිම කිරීමෙන් පසු | 389 | 97 |

**මූලාශ්‍රයː (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

### 2.18.3 සේවය ආරම්භ කිරීමට පෙර මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතු/සාධක

දත්ත විශ්ලේෂණයට අනුව සමස්ත නියැදියෙන් කම්කරුවන් 243 (61%) දෙනෙක් සේවය ආරම්භ කිරීමට පෙර කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරයි. මේ සම්බන්ධයෙන් හේතු විමර්ශනය කිරීමේදී ප්‍රස්තුත ගණනාවක් හඳුනාගත හැකිවිය. ඒ අනුව සේවය ආරම්භ කිරීමට පෙර කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන කම්කරුවන්ගෙන් බහුතරයක් එනම්, 197 (81%) දෙනෙක් පුරුද්දක් ලෙස කිසියම් හෝ මත්ද්‍රව්‍ය භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබිණ. දහතුන් දෙනෙක් (5%) කාර්යක්ෂමව

වැඩකිරීම සඳහා මත්ද්‍රව්‍ය භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබූ අතර 11 (4%) දෙනෙක් විශේෂ හේතුවක් නොමැති බවට ප්‍රතිචාර දක්වා තිබිණ. සේවය ආරම්භ කිරීමට ප්‍රථම කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වන ලද සෙසු කම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද හේතුන් පහත පරිදි විය.

**වගු අංක 05 -සේවය ආරම්භ කිරීමට පෙර මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතුව**

| සේවය ආරම්භ කිරීමට පෙර මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතුව | සංඛ්‍යාව | % |
|---|---|---|
| පුරුද්දට | 197 | 81.07 |
| විශේෂ හේතුවක් නැත | 11 | 4.53 |
| ශරීර වේදනාව නිසා | 4 | 1.65 |
| විනෝදයට | 5 | 2.06 |
| පාළුව නිසා | 3 | 1.23 |
| ප්‍රශ්න අමතක කරන්න | 1 | 0.41 |
| ආසාවට | 3 | 1.23 |
| කාර්යක්ෂමව වැඩ කිරීමට | 13 | 5.35 |
| යහළුවන් සමඟ එකතු වූ විට | 2 | 0.82 |
| ඇඟට ශක්තියක් එන නිසා | 2 | 0.82 |
| ආතතිය වැඩි නිසා | 1 | 0.41 |
| නිවැරදිව සේවය කරන්න | 1 | 0.41 |
| කික් එකක් ගන්න | 2 | 0.82 |
| එකතුව | 243 | 100 |

**මූලාශ්‍රයඃ (ක්‍ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

සේවය ආරම්භ කිරීමට පෙර කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන කම්කරුවන්ගෙන් 105 (43%) දෙනෙක් වැනි බහුතරයක් සේවය ආරම්භ කිරීමට පැයකට පෙර දී කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබූ අතර 84 (35%) දෙනෙක් විනාඩි 30 කට පෙර දී කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබුණි. විනාඩි 20 කට පෙර දී සහ පැය දෙකකට පෙරදී කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වන ලද කම්කරුවන් සංඛ්‍යාව 14 (6%) දෙනා බැගින් විය. සේවය ආරම්භ කිරීමට පෙර මත්ද්‍රව්‍යයක් භාවිත කරන සෙසු කම්කරුවන් මේ සම්බන්ධයෙන් ලබාදී තිබූ පිළිතුරු පහත පරිදි විය.

### 2.18.4 සේවයෙහිනිරතව සිටින අතරතුර මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතු/සාධක

සමස්ත නියැදිය තුළ නියෝජනය වූ කම්කරුවන්ගෙන් 189 (47%) දෙනෙක් සේවයෙහි නිරතව සිටින අතරතුර කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබිණ. ඔවුන්ගෙන් බහුතරයක් එනම්, 116 (61%) දෙනෙක් පුරුද්දක් ලෙස මත්ද්‍රව්‍ය භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබූ අතර 24 (13%) දෙනෙක් විශේෂ හේතුවක් නොමැති බවට ප්‍රතිචාර දක්වා තිබිණ. ඊට අමතරව 19 (10%) දෙනෙක් කාර්යක්‍ෂමව වැඩ කිරීම සඳහා මත්ද්‍රව්‍ය භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබිණ. සේවය කරන අතරතුර කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වන ලද සෙසු කම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද හේතුන් පහත පරිදි විය.

වගු අංක 06 - සේවය කරන අතරතුර මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතු

| සේවය කරන අතරතුර මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතුව | සංඛ්‍යාව | % |
|---|---|---|
| පුරුද්දට | 116 | 61.38 |
| විශේෂ හේතුවක් නැත | 24 | 12.70 |
| ශරීර වේදනාව නිසා | 7 | 3.70 |
| විනෝදයට | 2 | 1.06 |
| පාළුව නිසා | 5 | 2.65 |
| කාර්යක්ෂමව වැඩ කිරීමට | 19 | 10.05 |
| යහළුවන් සමඟ එකතු වූ විට | 2 | 1.06 |
| ඇඟට ශක්තියක් එන නිසා | 1 | 0.53 |
| මහන්සියට | 8 | 4.23 |
| ආතතිය වැඩි නිසා | 1 | 0.53 |
| කික් එකක් ගන්න | 1 | 0.53 |
| මහන්සිය නොදැනී වැඩකරන්න | 5 | 2.65 |
| ඒකාකාරීබවෙන් මිදීමට | 1 | 0.53 |
| එකතුව | 189 | 100 |

**මූලාශ්‍රයඃ (ක්ෂෙත්‍ර අධ්‍යයනය, 2018)**

### 2.18.5 විවේක කාලය අතරතුර මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතු/සාධක

විවේක කාලය අතරතුරදී කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන කම්කරුවන් ද නියැදිය තුළ නියෝජනය වූ අතර එම කම්කරු සංඛ්‍යාව 343 (86%) ක් විය. ඔවුන්ගෙන් බහුතරයක් එනම්, 144 (42%) දෙනෙක් කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබූ අතර 87 (25%) දෙනෙක් විනෝදය සඳහා කිසියම් මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබිණ. මහන්සි නොදැනී වැඩ කිරීමට, යහළුවන් සමඟ එකතු වූ විට, විශේෂ හේතුවක් නොමැත යන්න ප්‍රතිචාර දක්වන ලද කම්කරුවන් සංඛ්‍යාව පිළිවෙළින් 29 (8%), 22 (6%) සහ 20 (6%) දෙනෙක් විය. විවේක කාලය අතරතුර කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වන ලද සෙසු කම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද හේතූන් පහත පරිදි විය.

වගු අංක 07 - විවේක කාලය අතරතුර මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතුව

| විවේක කාලය අතරතුර මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතුව | සංඛ්‍යාව | % |
|---|---|---|
| පුරුද්දට | 144 | 41.983 |
| විශේෂ හේතුවක් නැත | 20 | 5.831 |
| ශරීර වේදනාව නිසා | 6 | 1.749 |
| විනෝදයට | 87 | 25.364 |
| පාළුව නිසා | 17 | 4.956 |
| ප්‍රශ්න අමතක කරන්න | 2 | 0.583 |
| ආසාවට | 11 | 3.207 |
| නිදිමත නැතිවීමට | 1 | 0.292 |
| යහළුවන් සමඟ එකතු වූ විට | 22 | 6.414 |
| මහන්සියට | 5 | 1.458 |
| ආතතිය වැඩි නිසා | 1 | 0.292 |
| කික් එකක් ගන්න | 2 | 0.583 |
| මහන්සිය නොදැනී වැඩකරන්න | 29 | 8.455 |
| එකතුව | 343 | 100 |

මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

### 2.18.6 සේවය නිම කිරීමෙන් පසු මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතු/සාධක

සේවය නිම කිරීමෙන් පසු කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වන ලද කම්කරුවන් සංඛ්‍යාව 389 (97%) දෙනෙක් විය. ඔවුන්ගෙන් බහුතරයක් ශරීර වේදනාව නිසා මත්ද්‍රව්‍ය භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබිණ. පනස් නව දෙනෙක් (15%) පුරුද්දක් ලෙසටත්, 76 (20%) දෙනෙක් මහන්සිය නැතිවීමටත්, 33 (8%) දෙනෙක් පාළුව නිසාත් මත්ද්‍රව්‍ය භාවිත කරන බවට ප්‍රතිචාර දක්වා තිබිණ. ඊට අමතරව 41 (11%) දෙනෙක් එයට විශේෂ හේතුවක් නොමැති බවට ප්‍රතිචාර දක්වා තිබිණ. සේවය නිම කිරීමෙන් පසු කිසියම් හෝ මත්ද්‍රව්‍යයක් භාවිත කරන බවට ප්‍රතිචාර දක්වන ලද සෙසු කම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද හේතුන් පහත පරිදි විය.

**වගු අංක 08 -සේවය අවසන් කළ පසු මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතුව**

| සේවය අවසන් කළ පසු මත්ද්‍රව්‍ය භාවිත කිරීමට හේතුව | සංඛ්‍යාව | % |
|---|---|---|
| පුරුද්දට | 59 | 15.167 |
| විශේෂ හේතුවක් නැත | 41 | 10.540 |
| ශරීර වේදනාව නිසා | 149 | 38.303 |
| විනෝදයට | 15 | 3.856 |
| පාළුව නිසා | 33 | 8.483 |
| ප්‍රශ්න අමතක කරන්න | 5 | 1.285 |
| ආසාවට | 3 | 0.771 |
| නින්දයාමට | 18 | 4.627 |
| නිදිමත නැතිවීමට | 1 | 0.257 |
| යහළුවන් සමඟ එකතු වූ විට | 17 | 4.370 |
| ඇඟට ශක්තියක් එන නිසා | 2 | 0.514 |
| මහන්සියට | 76 | 19.537 |
| ආතතිය වැඩි නිසා | 3 | 0.771 |
| ලිංගික කාර්යයේදී | 3 | 0.771 |
| කික් එකක් ගන්න | 1 | 0.257 |
| එකතුව | 389 | 100 |


මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)

### 2.19 කම්කරුවන් සේවය කරනු ලබන සේවා ස්ථාන පිහිටි ප්‍රදේශ තුළ මත්ද්‍රව්‍යවල සුලබතාවය

පුද්ගල මත්ද්‍රව්‍ය ඇබ්බැහිවීම සඳහා ජීව විද්‍යාත්මක / ජානමය සාධක, පරිසරය සහ මත්ද්‍රව්‍ය යන අවදානම් සාධක බලපානු ලැබේ. මත්ද්‍රව්‍ය යන ප්‍රධාන අවදානම් සාධකය යටතෙහි එන පුද්ගල මත්ද්‍රව්‍ය ඇබ්බැහිවීම සඳහා බලපාන එක් සාධකයක් ලෙස මත්ද්‍රව්‍යවල සුලබතාවය හඳුනාගත හැකි වේ.

කම්කරුවන් වර්තමානයේ සේවය කරනු ලබන සේවා ස්ථාන පිහිටි ප්‍රදේශ තුළ මත්ද්‍රව්‍ය ලබාගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් ද අධ්‍යයනය තුළ දී අවධානය යොමු කරන ලදි. ඒ අනුව නියදියට ඇතුළත් බහුතර කම්කරුවන් සංඛ්‍යාවක් එනම්, 163 (41%) දෙනෙක් තමා සේවය කරනු ලබන ප්‍රදේශය තුළ ඉතා පහසුවෙන් මත්ද්‍රව්‍ය ලබාගැනීමට හැකියාවක් පවතින බව ප්‍රකාශ කර තිබූ අතර 150 (38%) දෙනෙක් පහසුවෙන් මත්ද්‍රව්‍ය ලබාගතහැකි බව ප්‍රකාශ කර තිබිණ. මත්ද්‍රව්‍ය ලබාගැනීමට අපහසු බවට කම්කරුවන් 47 (12%) දෙනෙක් ද මත්ද්‍රව්‍ය ලබාගැනීමට ඇති හැකියාව සාමාන්‍ය බවට කම්කරුවන් 40 (10%) දෙනෙක් ද තවදුරටත් ප්‍රකාශ කර තිබිණ.

ප්‍රස්තාර අංක 28 - සේවා ස්ථාන පිහිටි ප්‍රදේශ තුළ මත්ද්‍රව්‍ය ලබාගැනීමට ඇති හැකියාව




**මූලාශ්‍රයඃ (ක්‍ෂේත්‍ර අධ්‍යයනය, 2018)**


නියැදිය තුළ නියොජනය වූ කම්කරුවන් සේවය කරනු ලබන සේවා ස්ථාන පිහිටි ප්‍රදේශ තුළ මත්ද්‍රව්‍යවල ඉහළ සුලබතාවක් පවතින බව ඉහත කරුණු අනුව පැහැදිලි වේ.

## 2.20 මත්ද්‍රව්‍ය භාවිතය සමග කම්කරුවන් සිදුකරන ලද නීතිවිරෝධී ක්‍රියා සහ ඔවුන්ට ඒ සඳහා ලැබී ඇති දඬුවම්

පුද්ගලමත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ සමාජය තුළ විවිධ නීතිවිරෝධී ක්‍රියාවන් සිදුවීම ඕනෑම සමාජයක හඳුනාගත හැකිය. අධ්‍යයනයට අනුව නියැදිය තුළ වූ ඇතැම් කම්කරුවන් ද විවිධ නීතිවිරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ වී ඇති බව අනාවරණය විය. ඒ අනුව ඔවුන් තම මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ සේවා ස්ථානය තුළදී සහ සේවා ස්ථානයෙන් පිටතදී විවිධ නීතිවිරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ වී ඇත.

අධ්‍යයන අනාවරණයන්ට අනුව නියැදිය තුළ වූ සමස්ත කම්කරුවන්ගෙන් 90 (23%) දෙනෙක් තම මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ කිසියම් නීතිවිරෝධී ක්‍රියාවකට සම්බන්ධ වී තිබූ අතර 310 (77%) දෙනෙක් කිසිඳු නීතිවිරෝධී ක්‍රියාවකට සම්බන්ධ වී නොතිබිණ. මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ තම සේවා ස්ථානය තුළදී කිසියම් නීතිවිරෝධී ක්‍රියාවකට සම්බන්ධ කම්කරුවන් 54 (14%) දෙනෙක් සිටි අතර ඔවුන්ගෙන් 22 (41%) දෙනෙක් සොරකම් කිරීමේ වරද සිදුකර ඇත. මූලික තොරතුරු සපයන්නන්ගෙන් අනාවරණය වූ කරුණු අනුව ද මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් විසින් ජංගම දුරකථන, මුදල් පසුම්බි, කම්බි කෑලි, සුළු ආයුධ සොරකම් කරනු ලැබූ අවස්ථාවන් පවතී. දහ දෙනෙක් (19%) මත්ද්‍රව්‍ය අලෙවි කිරීම ද, 4 (7%) දෙනෙක් සේවා ස්ථානය තුළ වූ දේපලවලට හානි කිරීම ද, එක් කම්කරුවෙක් (2%) මත්ද්‍රව්‍ය අලෙවියට සහය වීම ද සිදුකර තිබුණි. මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ සේවා ස්ථානය තුළ නීතිවිරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ කම්කරුවන්ගෙන් බහුතරයක් එනම්, 24 (44%) දෙනෙක් අනෙක් සේවකයන්ට පහරදීම සිදුකර ඇත.

ප්‍රස්තාර අංක 29 - සේවා ස්ථානය තුළ සිදු කරන ලද නීතිවිරෝධී ක්‍රියා




**මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

සේවා ස්ථානය තුළ සිදුවී ඇති නීතිවිරෝධී ක්‍රියාවන් දෙස අවධානය යොමු කිරීමේ දී මත්ද්‍රව්‍ය භාවිතයත් සමග අනෙක් සේවකයන්ට පහරදීම, සොරකම් කිරීම සෙසු වැරදි සිදුකිරීමට සාපේක්ෂව වැඩි බව තහවුරු වේ. එමෙන්ම සේවා ස්ථානය තුළ මත්ද්‍රව්‍ය අලෙවි කිරීමේ යම් ප්‍රවණතාවක් ද පවතින බව පැහැදිලි වේ.

මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ සේවා ස්ථානයෙන් පිටතදී නීතිවිරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ කම්කරුවන් 61 (15%) දෙනෙක් සිටි අතර ඔවුන්ගෙන් බහුතරයක් එනම්, 27 (44%) දෙනෙක් මත්ද්‍රව්‍ය අලෙවිය සිදුකර තිබිණ. විසි දෙනෙක් (33%) සොරකම් කිරීම ද, 11 (18%) දෙනෙක් ලිංගික අතවර ද, 8 (13%) දෙනෙක් මත්ද්‍රව්‍ය අලෙවියට සහය වීම ද සිදුකර තිබිණ. ගණිකා වෘත්තියෙහි නියැළි කාන්තාවන් දෙදෙනෙක් ද (13%) වූ අතර මංකොල්ලකෑම සහ අන්අයට පහරදීමේ වරද සිදුකරන ලද 4 (7%) දෙනෙක් බැගින් ද විය.

කම්කරුවන් තම මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ විවිධ වූ නීතිවිරෝධී ක්‍රියාවන් සේවා ස්ථානයෙන් පිටතදී පමණක් නොව සේවා ස්ථානය තුළ දී ද සිදුකරනු ලබන බව මේ අනුව තහවුරු වේ.


මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ කිසියම් නීතිවිරෝධී ක්‍රියාවකට සම්බන්ධ වී තිබූ කම්කරුවන් 90 (23%) දෙනාගෙන් 50 (56%) දෙනෙක් එම වැරදි ක්‍රියා සම්බන්ධයෙන් දඬුවම් ලබා තිබූ අතර 40 (44%) දෙනෙක් කිසිදු දඬුවමක් ලබා නොතිබිණ.

නීතිවිරෝධී ක්‍රියා සිදුකිරීම සම්බන්ධයෙන් දඬුවම් ලබා තිබූ කම්කරුවන් 50 (56%) දෙනාට රටේ පිළිගත් නෛතික පටිපාටිය අනුව හෝ සේවා ස්ථානය තුළ පවතින නීති පද්ධතිය යටතේ හෝ සමාජය තුළින් හෝ යම් දඬුවමක් ලබා තිබිණ. ඒ අනුව ඔවුන්ගෙන් බහුතරයක් එනම්, 32 (64%) දෙනෙක් සිර දඬුවම් ලබා තිබූ අතර 15 (30%) දෙනෙක් සේවා ස්ථානයට දඩ මුදල් ගෙවා තිබුණි.4 (8%) දෙනෙක් සේවය අත්හිටුවීම් වලට ද, 2 (4%) දෙනෙක් සේවා ස්ථානයෙන් පිටත දී මිනිසුන්ගේ පහරකෑම්වලට ද ලක්ව තිබිණ. ඊට අමතරව එක් අයෙකුට තමා සිදුකරන ලද වරද සඳහා වන්දි මුදලක් ගෙවීමට සිදුව තිබිණ.

## 2.21 මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් කම්කරුවන් සේවා ස්ථානයෙහි දී මුහුණ දී තිබෙන ගැටලු

සමස්ත නියැදියෙන් 124 (31%) දෙනෙක් මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් සේවා ස්ථානය තුළකිසියම් ගැටලුවකට මුහුණ දී තිබෙන බවට ප්‍රතිචාර දක්වා තිබූ අතර කිසිදු ගැටලුවකට මුහුණ දී නොමැති බවට 276 (69%) දෙනෙක් ප්‍රතිචාර දක්වා තිබිණි. කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයත් සමග මුහුණ දී ඇති ගැටලු පිළිබඳව අවධානය යොමු කිරීමේදී තම මත්ද්‍රව්‍ය භාවිතයත් සමග සේවා ස්ථානය තුළ කිසියම් ගැටලුවකට මුහුණ දී තිබෙන බවට ප්‍රතිචාර දක්වන ලද කම්කරුවන් අතරින් බහුතරයක් එනම්, 67 (54%) දෙනෙක් සෙසු සේවකයින් සමග ගැටුම් ඇතිකරගෙන තිබෙන බවට ප්‍රතිචාර දක්වා තිබිණ. අඛණ්ඩව සේවයට වාර්තා කිරීමට නොහැකි වීම සහ සේවා කටයුතු නිසි පරිදි ඉටුකිරීමට නොහැකි වීම යන ගැටලුවලට මුහුණ දී ඇති බව 52 (42%) දෙනා බැගින් ප්‍රකාශ කර තිබිණ. සුළු අනතුරුවලට මුහුණ දී ඇති බවට 26 (21%) දෙනෙක් ද නිලධාරීන් සමග මත ගැටුම් ඇතිවී තිබෙන බවට 4 (3%) දෙනෙක් ද ප්‍රකාශ කර තිබිණ. ඊට අතිරේකව සේවා ස්ථානයේ සෙසු සේවකයන් අතර තමා කොන් වී ඇති බවට එක් කම්කරුවෙක් ප්‍රකාශ කර තිබිණ.

**ප්‍රස්තාර අංක 30 - මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් සේවා ස්ථානය තුළ මුහුණ දී ඇති ගැටලු**




**මූලාශ්‍රයః (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් ඔවුන් විවිධ ගැටලුවලට මුහුණ දී ඇති බව ඉහත විශ්ලේෂිත කරුණු අනුව පැහැදිලි වේ.

## 2.22 සේවා ස්ථානය තුළ මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි සම්බන්ධයෙන් පනවා ඇති රීති හා මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි වැළැක්වීමට ගෙන ඇති වෙනත් ක්‍රියා මාර්ග

ඕනෑම සේවා ස්ථානයක එහි සංවිධානය හා ව්‍යුහය විධිමත්ව පවත්වාගෙන යාම සඳහාත් එහි මනා ක්‍රියාකාරිත්වය සඳහාත් විවිධ විෂයයන්ට අදාළව රීති පනවා තිබිය හැකිය. ගොඩනැගිලි ඉදිකිරීමේ සේවා ස්ථාන තුළ මත්ද්‍රව්‍ය භාවිතය, අලෙවිය සහ ළඟ තබාගැනීම යනා දී මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි දෛනික රීති මගින් තහනම්කර තිබේ ද? යන්න අධ්‍යයනයෙහි දී විමසා බලන ලදි. මත්ද්‍රව්‍ය වැරදි සම්බන්ධයෙන් සේවා ස්ථානයේ දෛනික රීති මගින් තහනම්කර තිබෙන බවට නියැදියට ඇතුළත් සමස්ත කම්කරුවන් ප්‍රතිචාර දක්වා තිබුණි. ඒ සම්බන්ධයෙන් මූලික තොරතුරු සපයන්නන් විසින් ලබා දී තිබූ තොරතුරු අනුව ද ඒ බව තවදුරටත් තහවුරු විය.

"සේවා ස්ථානය තුළට මත්ද්‍රව්‍ය රැගෙන ඒම, ළඟ තබාගැනීම, අලෙවි කිරීම හෝ භාවිත කිරීම සිදුකළ නොහැකි වේ. යම් හෙයකින් මත්ද්‍රව්‍ය ළඟ තිබී හමුවුවහොත් සති දෙකකට වැඩ තහනම් කරන අතර භාවිත කර හසුවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ."

"සේවා ස්ථාන තුළ රීති හරිම තදයි. ඒගොල්ලන්ගේ බෑග් පවා පරීක්ෂා කරනවා. ඒ නිසා ඇතුළේ මත්ද්‍රව්‍ය අලෙවියක් වෙන්න ඉඩක් නෑ"

"මත්ද්‍රව්‍ය භාවිතය, ළඟ තබාගැනීම තහනම් අතර ඒවාට වෙන වෙනම දඩ මුදල් නියම කර තිබේ. කම්කරුවන් බඳවා ගන්නා ගිවිසුම යටතේ මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සිදු කළ නොහැකි බවට කරුණු ඇතුළත් කරලා තියෙන්නේ."

කම්කරුවන් විසින් සිදු කළ හැකි මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදි අවම කිරීම සහ වැළැක්වීම සඳහා පනවා ඇති රීතිවලට අමතරව වෙනත් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම ද සිදු කරන බව මෙම අධ්‍යයනයේ දී හඳුනාගත හැකිවිය. මත්ද්‍රව්‍ය භාවිත කර සේවයෙහි නිරතවීමෙහි ඇති බරපතලකම සම්බන්ධයෙන් දෛනිකව පවත්වනු ලබන රැස්වීම්වල දී කම්කරුවන් දැනුවත් කිරීමත් මත්ද්‍රව්‍ය භාවිත කිරීමෙහි ප්‍රතිවිපාක දැක්වෙන පෝස්ටර්, උපදෙස් දැක්වෙන පත්‍රිකා සේවා ස්ථානය තුළ ප්‍රදර්ශනය කිරීමත් සිදු කරන බවට මූලික තොරතුරු සපයන්නන්ගෙන් තොරතුරු අනාවරණය විය.

"සෑම උදෑසනකම 7.30 ට රැස්වීමක් කැඳවීම. එහි දී ආරක්ෂාව පිළිබඳව මෙන්ම මත්ද්‍රව්‍ය භාවිත කිරීමෙන් ඇති වන තත්ත්වය හා අවධානම වටහා දීම සිදු කරනු ලබයි."

"සේවා ස්ථානය තුළ තැනින් තැන මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රතිවිපාක දැක්වෙන පෝස්ටර් ගහලා තියෙනවා."

"මත්ද්‍රව්‍ය භාවිත කිරීම තහනම් කර ඇති අතර ආයතනය තුළට පිවිසෙන ස්ථානයේ උපදෙස් ප්‍රදර්ශනය කිරීමක් ද සිදු කර ඇත."

## 2.23කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සේවා ස්ථානයේ නිලධාරීන්ගේ දැනුවත්භාවය හා ඒ සමඟ ගෙන ඇති පියවර

නියදිය තුළ නියෝජනය වූ කම්කරුවන් අතරින් 201 (50%) දෙනෙකුගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සේවා ස්ථානයේ නිලධාරීන් දැනුවත්වී තිබූ අතර සෙසු කම්කරුවන්ගේ එනම්, 199 (50%) දෙනෙකුගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සේවා ස්ථානයේ නිලධාරීන් දැනුවත්වී නොතිබිණ.

කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සේවා ස්ථානයේ නිලධාරීන් දැනුවත්වීමත් සමඟ ඔවුන්ගෙන් ලැබුණු ප්‍රතිචාර කෙබඳුද යන්නත් අධ්‍යයනය තුළ දී අවධානය යොමු කරන ලදි. ඒ අනුව කම්කරුවන් 201 (50%) දෙනා අතරින් 167 (83%) දෙනෙකුට අවවාද කර තිබූ අතර 82 (41%) දෙනෙකුට බැනවැදී තිබුණි. ඇතැම් කම්කරුවන්ගේ සේවය අත්හිටුවීමට පවා නිලධාරීන් කටයුතු කර තිබූ අතර එම කම්කරු සංඛ්‍යාව 14 (7%) දෙනෙකි. 14 (7%) දෙනෙකුට උපදෙස් ලබාදීමත් 7 (3%) දෙනෙකුට දඩමුදල් නියම කිරීමත් සිදුකර තිබූ අතර කම්කරුවන් 5 (2%) දෙනෙකු සේවයෙන් ඉවත්කර තිබිණ. අධ්‍යයනයේ දී අනාවරණය වූ ආකාරයට තම මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් සේවයෙන් ඉවත්වීමට සිදුවූ සේවකයින්ගේ පෙරැත්ත කිරීම මත නැවත ඔවුන්ව සේවයෙහි පිහිටුවීමට අදාළ නිලධාරීන් කටයුතු කර ඇත. කම්කරුවන්ගේ 4 (2%) දෙනෙකුගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සේවා ස්ථානයේ නිලධාරීන් කිසිඳු ප්‍රතිචාරයක් දක්වා නොතිබිණ.

මත්ද්‍රව්‍ය සම්බන්ධ වැරදි සිදු කළහොත් උපදෙස් දීම, අවවාද කිරීම, බැනවැදීම, දඩමුදල් නියම කිරීම හෝ සේවයෙන් ඉවත් කිරීම යන දඬුවම් ලබා දීමට කටයුතු කරන බවත් ඇතැම් අවස්ථාවන්හි දී පොලීසියට දැනුම් දීමට කටයුතු කරන බවත් මූලික තොරෙතුරු සපයන්නන් විසින් ලබාදෙන ලද කරුණු අනුව ද පැහැදිලි විය.


"හෙරොයින්, ගංජා භාවිත කර අහුවුනොත් අනිවාර්යයෙන් සේවයෙන් ඉවත් කරනවා. අරක්කු බීලා අහුවුනොත් මුලින් හදාගන්න උපදෙස් දෙනවා. එසේත් නැත්නම් අවවාද කරනවා. එහෙම කරලත් නතර කළේ නැත්නම් සේවයෙන් ඉවත් කරනවා."

"යම් මත්ද්‍රව්‍යයක් භාවිත කර ප්‍රථම වතාවට අසුවුවහොත් රැස්වීම ඉස්සරහට ගෙනත් අවවාද කරනවා. පිරිස ඉස්සරහා බනිනවා, ඔවුන්ව අපහසුතාවට පත්වෙන්න. ලැජ්ජාව නිසාවෙන් නැවත නොකිරීමටයි එහෙම නරන්නේ. ඉන්පසුව මත්ද්‍රව්‍ය භාවිත කරන්නේ නම් දඩමුදල් නියම කරනවා. ඉන් අනතුරුවත් මත්ද්‍රව්‍ය භාවිත කරන්නේ නම් සේවයෙන් ඉවත් කරනවා"

## 2.24සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථානවල පදිංචි කම්කරුවන් දැනට භාවිත කරන මත්ද්‍රව්‍ය/ මත්පැන් වර්ග

නියැදියට ඇතුළත් කම්කරුවන්ගේ පදිංචි ස්ථානය සලකාබැලීමේ දී සමස්ත කම්කරුවන්ගෙන් බහුතරයක් එනම්, 179 (45%) දෙනෙක් සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථානවල පදිංචිව සිටින බව අනාවරණය විය. ඔවුන්ගෙන් 178 (99%) දෙනෙක් වැනි බහුතරයක් දැනට සිගරට්/ දුම්වැටි භාවිත කරන්නන් වූ අතර 158 (88%) දෙනෙක් කේරල ගංජා භාවිතා කරන්නන් විය. 145 (81%) දෙනෙක් නීත්‍යානුකූල මද්‍යසාර ද, 47 (26%) දෙනෙක් දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන ද, 23 (13%) දෙනෙක් දේශීය ගංජා ද 11 (61%) දෙනෙක් නීතිවිරෝධි මද්‍යසාර ද (කසිප්පු) භාවිත කරන්නන් විය. ඊට අමතරව 42 (23%) දෙනෙක් හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් භාවිත කරන්නන් විය.

**ප්‍රස්තාර අංක 31 - සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථානවල පදිංචි කම්කරුවන් දැනට භාවිතකරන මත්ද්‍රව්‍ය/ මත්පැන් වර්ග**




**මූලාශ්‍රයඃ (ක්ෂෙත්‍ර අධ්‍යයනය, 2018)**

අන්තරායකර ඖෂධ ගණයට ගැනෙන මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් සළකා බැලීමේදී, කේරළ ගංජා භාවිත කිරීමේ ඉහළ ප්‍රවණතාවක් සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථානවල පදිංචි කම්කරුවන් අතර පවතින බව ඉහත විශ්ලේෂිත කරුණු අනුව පැහැදිලි වේ.

## 2.25 කම්කරුවන් දිනපතා භාවිත කරන මත්ද්‍රව්‍ය සහ පදිංචි වාසස්ථානය


### 2.25.1 දිනපතා කේරළ ගංජා භාවිතය සහ පදිංචි වාසස්ථානය

නියැදියට ඇතුළත් කේරළ ගංජා භාවිත කරන 314 (79%) දෙනාගේ කේරළ ගංජා භාවිත කිරීමේ වාර ගණන සම්බන්ධයෙන් සළකා බැලීමේදී ඔවුන්ගෙන් බහුතර දෙනෙක් එනම්, 171 (54%) දෙනෙක් දිනපතා කේරල ගංජා භාවිත කරන බවට අධ්‍යයනය තුළින් තොරතුරු අනාවරණය විය.

දිනපතා කේරළ ගංජා භාවිත කරන කම්කරුවන් 171 (54%) දෙනාගේ පදිංචි ස්ථාන සළකා බැලීමේදී බහුතරයක් එනම් 86 (50%) දෙනෙක් සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථානවල පදිංචිවූවන් විය. තිස්නව දෙනෙක් (23%) කුලී නිවාසවල ද, 25 (15%) දෙනෙක් තම නිවසෙහිද 17 (10%) දෙනෙක්

මිතුරකුගේ නිවසෙහිද පදිංචිව සිටින බවට තොරතුරු අනාවරණය විය. ඊට අමතරව 4 (2%) දෙනෙක් නැදෑ නිවෙස්වල පදිංචිවූවන් විය.

**ප්‍රස්තාර අංක 32 - දිනපතා කේරළ ගංජා භාවිත කරන කම්කරුවන් පදිංචි ස්ථානය**




**මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**


ඒ අනුව සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථානවල පදිංචි කම්කරුවන් අතර දිනපතා කේරළ ගංජා භාවිත කිරීමේ ඉහළ ප්‍රවණතාවයක් පවතින බව ඉහත විශ්ලේෂිත කරුණු අනුව තහවුරු වේ.

### 2.25.2 දිනපතා දේශීය ගංජා භාවිතය සහ පදිංචි වාසස්ථානය

නියැදියට ඇතුළත් වූ දේශීය ගංජා දැනට භාවිත කරන කම්කරුවන් 120 (30%) දෙනාගේ දේශීය ගංජා භාවිත කිරීමේ වාර ගණන සම්බන්ධයෙන් සළකා බැලීමේදී, 38 (32%) දෙනෙක් දිනපතා දේශීය ගංජා භාවිත කරන බවට අධ්‍යයනය තුළින් තොරතුරු අනාවරණය විය.

දිනපතා දේශීය ගංජා භාවිත කරන කම්කරුවන් 38 (32%) දෙනාගේ පදිංචි ස්ථාන සළකා බැලීමේදී ඔවුන්ගෙන් බහුතරයක් එනම් 15 (39%) දෙනෙක් කුලී නිවෙස්වල පදිංචි වූවන් විය. දහ දෙනෙක් (26%) සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථාන වලද, 6 (16%) දෙනෙක් මිතුරකුගේ නිවසෙහි ද, 3 (9%) දෙනෙක් තම නිවසෙහි ද වාසය කරන්නන් වූ අතර 4 (11%) දෙනෙක් නෑදෑ නිවෙස්වල පදිංචිවූවන් විය.

**ප්‍රස්තාර අංක 33 - දිනපතා දේශීය ගංජා භාවිත කරන කම්කරුවන් පදිංචි ස්ථානය**




**මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**


දේශීය ගංජා දිනපතා භාවිත කිරීමේ ඉහළ ප්‍රවණතාවක් කුලී නිවෙස්වල පදිංචි කම්කරුවන් අතර පවතින බව ඉහත විශ්ලේෂිත කරුණු අනුව තහවුරු වේ.

### 2.25.3 දිනපතා හෙරොයින් භාවිතය සහ පදිංචි වාසස්ථානය

නියැදියට ඇතුළත් කම්කරුවන්ගෙන් 36 (9%) දෙනෙක් හෙරොයින් භාවිත කරන්නන් වූ අතර ඔවුන්ගෙන් 10 (28%) දෙනෙක් දිනපතා හෙරොයින් භාවිත කරන බවට තොරතුරු අනාවරණය විය.

දිනපතා හෙරොයින් භාවිත කරන කම්කරුවන් 10 (28%) දෙනාගේ පදිංචි ස්ථාන සලකා බැලීමේදී අනාවරණය වූයේ එයින් බහුතරයක් එනම් 5 (50%) දෙනෙක් තම නිවසෙහි පදිංචිව සිටින බවයි. තුන් දෙනෙක් (30%) සේවා ස්ථානයෙන් සපයන ලද වාසස්ථානවල පදිංචිව සිටින අතර කුලී නිවෙස්වල එක් කම්කරුවෙක් ද (10%), නැදෑ නිවෙස්වල එක් කම්කරුවෙක් ද පදිංචිව සිටියි.

**ප්‍රස්තාර අංක 34 - දිනපතා හෙරොයින් භාවිත කරන කම්කරුවන් පදිංචි ස්ථානය**




**මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

දිනපතා හෙරොයින් භාවිත කිරීමේ ඉහළ ප්‍රචලිත බවක් තම නිවසෙහි පදිංචි කම්කරුවන් අතර පවතින බව මේ අනුව පැහැදිලි වේ.

## 2.26 කම්කරුවන් විසින් සිදුකරන ලද නීතිවිරෝධී ක්‍රියා සහ ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය

අධ්‍යයන දත්තවලට අනුව මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ කිසියම් නීතිවිරෝධී ක්‍රියාවකට සම්බන්ධ වී තිබූ කම්කරු සංඛ්‍යාව 90 (23%) දෙනෙක් විය. ඔවුන්ගෙන් 54 (14%) දෙනෙක් සේවා ස්ථානය තුළදී කිසියම් නීතිවිරෝධී ක්‍රියාවක් සිදුකර තිබූ අතර 61 (15%) දෙනෙක් සේවා ස්ථානයෙන් පිටතදී කිසියම් නීතිවිරෝධී ක්‍රියාවකට සම්බන්ධ වී තිබිණි.

සේවා ස්ථානය තුළදී කිසියම් නීතිවිරෝධී ක්‍රියාවක් සිදුකර තිබූ කම්කරුවන් 54 (14%) දෙනාගෙන් බහුතර කම්කරු සංඛ්‍යාවක් එනම් 24 (44%) දෙනෙක් සේවා ස්ථානයේ සෙසු සේවකයින්ට පහරදීමේ වරද සිදුකර තිබූ අතර 22 (41%) දෙනෙක් සොරකම් කිරීමේ වරද සිදුකර තිබිණි. දහ දෙනෙක් (19%) මත්ද්‍රව්‍ය අලෙවිය ද, 4 (7%) දෙනෙක් දේපලවලට අලාභහානි කිරීම ද, 1 (2%) පුද්ගලයෙක් මත්ද්‍රව්‍ය අලෙවියට සහයවීමේ වරද ද සිදුකර තිබිණි.

කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ සේවා ස්ථානයේ සෙසු සේවකයින්ට පහරදීම, හොරකම් කිරීම, මත්ද්‍රව්‍ය අලෙවිය වැනි නීතිවිරෝධී ක්‍රියාවන් සිදු කිරීමේ තත්ත්වයක් පවතින බව මේ අනුව තහවුරු වේ.

තම මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ සේවා ස්ථානයේ සෙසු සේවකයින්ට පහරදීමේ වරද සිදුකරන ලද කම්කරුවන් 24 (44%) දෙනාගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධව සළකාබැලීමේදී ඔවුන්ගෙන් බහුතරයක් එනම්, 23 (96%) දෙනෙක් සිගරට්/ දුම්කුඩු කවදා හෝ භාවිත කර තිබුණි. 21 (88%) දෙනෙක් නීත්‍යානුකූල මද්‍යසාර ද, 20 (83%) දෙනෙක් කේරල ගංජා ද, 16 (67%) දෙනෙක් විවිධ පෙති වර්ග ද භාවිත කර තිබුණි. ඊට අමතරව 12 (50%) දෙනෙක් දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන ද, 13 (54%) දෙනෙක් දේශීය ගංජා ද, 14 (58%) දෙනෙක් හෙරොයින් ද, කවදා හෝ භාවිත කර තිබිණි. නීතිවිරෝධී මද්‍යසාර, සිරප් වර්ග, කොකේන් කවදා හෝ භාවිත කළ පුද්ගලයින් සිටි අතර එම පුද්ගල සංඛ්‍යාව පිළිවෙළින් 9 (38%), 4 (17%) සහ 1 (4%) විය. මදනමෝදක, හෂිස්, මෙතම්පිටමින් සහ හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් කෙදිනක හෝ භාවිත කළ කම්කරුවන් 6 (25%) දෙනෙක් ද ඒ අතර සිටි බවට අධ්‍යයනය තුළින් තොරතුරු අනාවරණය විය.

ඉහත විශ්ලේෂිත කරුණු අනුව පැහැදිලි වන්නේ, සේවා ස්ථානය තුළ කිසියම් නීතිවිරෝධී ක්‍රියාවකට සම්බන්ධ වී තිබූ කම්කරුවන් අතර සිගරට්/ දුම්වැටි වැනි ප්‍රාථමික මත්ද්‍රව්‍ය සහ කේරළ ගංජා නීත්‍යානුකූල මද්‍යසාර, හෙරොයින්, දේශීය ගංජා වැනි අන්තරායකර ඖෂධ කවදා හෝ භාවිත කර තිබීමේ ඉහළ ප්‍රචලිත බවක් පවතින බවයි.

නියැදියට ඇතුළත් කම්කරුවන් 54 (14%) දෙනෙක් සේවා ස්ථානය තුළදී කිසියම් වරදක් සිදුකර තිබූ අතර ඔවුන්ගෙන් 22 (41%) දෙනෙක් සොරකම් කිරීමේ වරද සිදුකර තිබිණි.

ඔවුන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී අනාවරණය වූයේ සොරකම් කිරීමේ වරද සිදුකරන ලද කම්කරුවන් සියලු දෙනාම කවදා හෝ කේරළ ගංජා භාවිත කර තිබූ බවයි. විසි එක් දෙනෙක් (95%) සිගරට්/ දුම්වැටි ද, 18 (82%) දෙනෙක් දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන ද 17 (77%) දෙනෙක් නීත්‍යානුකූල මද්‍යසාර ද කවදා හෝ භාවිත කර තිබුණි. දේශීය ගංජා සහ විවිධ පෙති වර්ග කවදා හෝ භාවිත කළ කම්කරු පිරිස 14 (64%) දෙනා බැගින් වූ අතර 10 (45%) දෙනෙක් හෙරොයින් කවදා හෝ භාවිත කර තිබුණි. ඒ අතර නීතිවිරෝධී මධ්‍යසාර (කසිප්පු) සහ සිරප් වර්ග කවදා හෝ භාවිත කළ කම්කරුවන් 7 (32%) දෙනා බැගින් ද විය. කොකේන් හා එල්.එස්.ඩී කවදා හෝ භාවිත කළ කම්කරුවන් පිළිවෙලින් 3(14%) සහ 1 (5%) ක් විය. ඊට අමතරව 6 (27%) දෙනෙක් මදනමෝදක, හෂිස්, මෙතම්පිටමින් සහ හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් කවදා හෝ භාවිත කර තිබූ බවට තොරතුරු අනාවරණය විය.

සේවා ස්ථානය තුළ හොරකම් කිරීමේ වරද සිදුකරන ලද කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ ඉහත විශ්ලේෂිත කරුණු අනුව සේවා ස්ථානය තුළ සොරකම් කිරීමේ වරද සිදුකරන ලද කම්කරුවන් කවදා හෝ කේරල ගංජා භාවිතා කර තිබෙන බව තහවුරු වේ.

සේවා ස්ථානය තුළ මත්ද්‍රව්‍ය අලෙවිය සිදුකරන ලද කම්කරුවන් 10 (19%) දෙනාගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සලකා බැලීමේදී කම්කරුවන් 10 බැගින් සිගරැට්/දුම්වැටි, නීත්‍යානුකූල මද්‍යසාර සහ කේරල ගංජා කවදා හෝ භාවිත කර තිබූ බවට තොරතුරු අනාවරණය විය. හය දෙනෙක් (60%) පෙති වර්ග ද, 5 (50%) දෙනෙක් දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන ද, 4 (40%) දෙනෙක් නීතිවිරෝධී මධ්‍යසාර ද (කසිප්පු), 3 (30%) දෙනෙක් දේශීය ගංජා ද කවදා හෝ භාවිත කර තිබිණි. හෙරොයින් සහ සිරප් වර්ග කවදා හෝ භාවිත කර තිබූ කම්කරුවන් සංඛ්‍යාව 2 (20%) බැගින් විය. එක් කම්කරුවෙක් පමණක් කොකේන් කවදා හෝ භාවිත කර තිබූ අතර 3(30%) දෙනෙක් මදනමෝදක,හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් කවදා හෝ භාවිත කර තිබිණි.

ඉහත විශේෂිත තොරතුරු අනුව සේවා ස්ථානය තුළ මත්ද්‍රව්‍ය අලෙවිය සිදුකරන ලද කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් හඳුනාගත හැකි විශේෂ කරුණ වූයේ ඔවුන් සිගරැට්/දුම්වැටි, නීත්‍යානුකූල මද්‍යසාර, සහ කේරල ගංජා කවදා හෝ භාවිත කර තිබීමේ ඉහළ ප්‍රචලිත බවක් පවතින බවයි.

## 2.27 කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය හා අධිමාත්‍රාවීම


සිහි මුර්ජාව හෝ සිහිවිකල් බව ඇතිකරන තරමට පමණට වඩා මත්ද්‍රව්‍ය ගැනීම හෝ විවිධ මත්ද්‍රව්‍ය එකට මිශ්‍ර කරගැනීම අධිමාත්‍රාවීම යන්නෙහි අදහස වේ. පොදුවේ මෙවන් අවස්ථාවන්හි දී හුස්ම ගැනීමේ අපහසුතාවය, දෙතොල් නිල්පැහැවීම, ඇසේ කළු ඉංගිරියාව / දෑස සංකෝචනය වීම වැනි ලක්‍ෂණ මතුවේ. මෙවන් තත්ත්වයන්ට මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින් මුහුණදිය හැකි අතර මෙම අධ්‍යයනයෙහිදී ද නියැදියට ඇතුළත් වූ කම්කරුවන් කෙදිනක හෝ අධිමාත්‍රාවී තිබේ ද යන්න විමසා බලන ලදි. ඒ අනුව සමස්ත නියැදියෙන් කම්කරුවන් 14 (4%) දෙනෙක් අධිමාත්‍රාවී තිබූ අතර ඔවුන්ගෙන් 8 (57%) දෙනෙක් අධිමාත්‍රාවීමත් සමඟ ප්‍රතිකාර සඳහා යොමු වී තිබුන ද 6 (43%) දෙනෙක් ප්‍රතිකාර සඳහා යොමු වී නොතිබිණ.

## 2.28 කම්කරුවන් සිය මත්ද්‍රව්‍ය භාවිතයෙන් මිදීම සඳහා ප්‍රතිකාර ලබාගැනීම

සමස්ත නියැදියෙන් 105 (26%) දෙනෙක් සිය මත්ද්‍රව්‍ය භාවිතය නතර කිරීමට උත්සහ ගෙන තිබිණ. 295 (73%) දෙනෙක් සිය මත්ද්‍රව්‍ය භාවිතය නතර කිරීමට කෙදිනක හෝ උත්සහ කර නොතිබිණ.

සිය මත්ද්‍රව්‍ය භාවිතය නතර කිරීමට උත්සහ කළ කම්කරුවන් ස්වයං උත්සහයෙන් හෝ වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීමෙන් හෝ පුනරුත්ථාපනය වීමෙන් එයින් මිදීමට උත්සහ කර තිබිණ. ඒ අනුව බහුතරයක් එනම්, 66 (63%) දෙනෙක් ස්වයං උත්සහයෙන් මත්ද්‍රව්‍ය භාවිතය නැවැත්වීමට උත්සහ කර තිබිණ. තිස් අට දෙනෙක් (36%) පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් ප්‍රතිකාර ලබා තිබූ අතර 7 (7%) දෙනෙක් රජයේ රෝහල්වලින් ප්‍රතිකාර ලබා තිබිණ. කම්කරුවන් 5 (5%) දෙනා බැගින් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් හා ආයුර්වේද ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් ප්‍රතිකාර ලබා තිබිණ. ඊට අමතරව 3 (3%) දෙනෙක් පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානවලින් නේවාසික ප්‍රතිකාර ලබා තිබූ අතර 2 (2%) දෙනෙක් රාජ්‍ය නොවන වෛද්‍ය මධ්‍යස්ථානවලින් නේවාසික ප්‍රතිකාර ලබාගෙන තිබිණ.

**ප්‍රස්තාර අංක 35 - කම්කරුවන් සිය මත්ද්‍රව්‍ය භාවිතය නතර කිරීමට උත්සාහ කර ඇති ආකාරය**





**මූලාශ්‍රයː (ක්ෂෙත්‍ර අධ්‍යයනය, 2018)**

## 2.29මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ කම්කරුවන් මුහුණ දී ඇති සෞඛ්‍ය ගැටලු

දීර්ඝ කාලයක් මත්ද්‍රව්‍ය භාවිත කිරීම නිසා මත්ද්‍රව්‍ය භාවිත කරන පුද්ගලයින්ට විවිධ ශාරීරික ව්‍යාධි හෝ මානසික ව්‍යාධි ඇති විය හැකිය. මෙම අධ්‍යයනයේදී ද නියැදිය තුළ නියෝජනය වූ කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ ඔවුන් මුහුණ දී තිබෙන සෞඛ්‍ය ගැටලු සම්බන්ධයෙන් විමසීමක් කරන ලදි. ඒ අනුව සමස්ත නියැදියෙන් කම්කරුවන් 24 (6%) දෙනෙක් කිසියම් රෝගී තත්ත්වයකින් පෙලෙන්නේ යැයි සඳහන් කර තිබිණ. ඔවුන් අතරින් 13 (54%) දෙනෙක් සෙම රෝගයෙන් පෙළෙන බවට ප්‍රතිචාර දක්වා තිබූ අතර ඇදුම, ක්ෂය රෝගය, ලිංගික බෙලහීනතාවය යන ගැටලුවලට මුහුණ දී ඇති බවට කම්කරුවන් 2 (8%) දෙනා බැගින් ප්‍රතිචාර දක්වා තිබිණ. කම්කරුවන් එක් අයෙකු බැගින් පෙනහළු ආශ්‍රිත ගැටලු, හිසේ කැක්කුම, පපුවෙ කැක්කුම, මුඛයේ තුවාල ඇතිවීම සහ හුස්මගැනීමේ අපහසුතා ඇතිවීම යන සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දී තිබෙන බවට ප්‍රතිචාර දක්වා තිබිණ. නියැදියෙහි වූ කම්කරුවන් අතරින් 376 (94%) දෙනෙක් තමන්ට කිසිඳු රෝගාබාධයක් වැළඳී නොමැති බවට ප්‍රතිචාර දක්වා තිබිණ.

**ප්‍රස්තාර අංක 36 - මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ කම්කරුවන් මුහුණ දී ඇති සෞඛ්‍ය ගැටලු**




**මූලාශ්‍රයඃ (ක්ෂේත්‍ර අධ්‍යයනය, 2018)**

## 3 නිගමන

- ගොඩනැඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නියුතු කම්කරුවන් බහුවිධ මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් බවත් ඔවුන් අතර මත්ද්‍රව්‍ය භාවිතයෙහි ඉහළ ප්‍රවණතාවක් පවතින බවත් නිගමනය කළ හැකි වේ.

- කම්කරුවන් විසින් නීතිවිරෝධී මත්ද්‍රව්‍ය ලෙස ගැනෙන කේරල ගංජා, දේශීය ගංජා, සහ හෙරොයින්බහුලව භාවිත කරනු ලබන අතර කේරල ගංජා භාවිත කිරීමේ ඉහළම ප්‍රවණතාවක් පවතී. එමෙන්ම නීත්‍යානුකූල මද්‍යසාර, වෛද්‍යමය අරමුණු සඳහා ගැනෙන ඖෂධ ( පෙති වර්ග), දුම්කුඩු ආශ්‍රිත නිෂ්පාදන, හුණු තවරන ලද දුම්කොළ සහිත පුවක් බහුලව භාවිතයෙහි ප්‍රවණතාවක් පවතී. ප්‍රාථමික මත්ද්‍රව්‍යක් ලෙස ගැනෙන සිගරට් භාවිතයෙහි ද ඉහළ ප්‍රවණතාවක් පවතී. මීට අමතරව එල්.එස්.ඩී (LSD)සහ සිරප් වර්ග භාවිතයෙහි ඉතා සුළු ප්‍රවණතාවක් පවතී.

- දැනට කේරළ ගංජා භාවිත කරන කම්කරුවන්ගෙන් බහුතරයක් තම අවශ්‍යයතාව සඳහා සේවා ස්ථානය තුළ වූ මිතුරන්ගෙන් කේරල ගංජා සපයාගැනීමේ ඉහළ ප්‍රවණතාවයක් පවතින බව පෙනී යන්නේය.

- දැනට ඖෂධ (පෙති වර්ග) භාවිත කරන කම්කරුවන්ගෙන් බහුතරයක් පෞද්ගලික ඖෂධහල්වලින් ඖෂධ (පෙති වර්ග) ලබාගනී.

- පුහුණු ශ්‍රමිකයන්, නුපුහුණු ශ්‍රමිකයන් සහ අර්ධ පුහුණු ශ්‍රමිකයන් ලෙස ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නියුතු කම්කරුවන් අතර මත්ද්‍රව්‍ය භාවිතයෙහි ප්‍රවණතාවක් පවතින බව හඳුනාගත හැකිය. පුහුණු ශ්‍රමිකයන් ලෙස සේවය කරනු ලබන කම්කරුවන් අතර මත්ද්‍රව්‍ය භාවිතයෙහි ඉහළම ප්‍රවණතාවක් පවතින අතර පෙදරේරුවරුන්, යකඩ පෑස්සුම්කරුවන්, කම්බිබඳින්නන්, වඩුවැඩ සිදුකරන්නන්, විදුලි කාර්මිකයින්, ගල් අතුරන්නන්, තීන්ත ආලේප කරන්නන් සහ ග්‍රයින්ඩර්කරුවන් ඒ අතර වන බව නිගමනය කළ හැකි වේ.

- ➢ සේවය සඳහා පැමිණි කෙදිනක හෝ කිසිදු මත්ද්‍රව්‍යයක් භාවිත කර නොමැති පුද්ගලයින් හට මත්ද්‍රව්‍ය භාවිතය කෙරෙහි යොමුවීම සඳහා සේවායෝජක එමෙන්ම ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩබිම්වල සේවයෙහි නියුතු මත්ද්‍රව්‍ය භාවිත කරන කම්කරුවන් බලපෑමක් වී ඇති බව නිගමනය කළ හැකි වේ. කම්කරුවන් 11 (3%) දෙනෙකුට එම සේවා ස්ථානයනයෙහි සේවයෙහි නියුතු මිතුරෙකු විසින් ප්‍රථම වරට මත්ද්‍රව්‍යයක් හඳුන්වා දී ඇති බවටත් කම්කරුවන් 3 (1%) දෙනෙකුට සේවායෝජක සහ රියදුරු සහයක මඟින් ප්‍රථම වරට මත්ද්‍රව්‍යයක් හඳුන්වා දී ඇති බවටත් අධ්‍යයනය තුළින් තොරතුරු අනාවරණය විය.

- ➢ කම්කරුවන් සේවය කරනු ලබන ප්‍රදේශය තුළ ඉතා පහසුවෙන් මත්ද්‍රව්‍ය ලබාගැනීමට හැකියාවක් පවති.

- ➢ කම්කරුවන් 201 (50%) දෙනෙකුගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සේවා ස්ථානයේ නිලධාරීන් දැනුවත්වී තිබූ බවට නිගමනය කළ හැකි වේ.

- ➢ කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සේවා ස්ථානයේ නිලධාරීන් දැනුවත්වීමත් සමඟ නිලධාරීන් විසින් කම්කරුවන් සම්බන්ධයෙන් අවවාද කිරීම, බැනවැදීම, උපදෙස් දීම, දඩ මුදල් නියම කිරීම, සේවය අත්හිටුවීම, සේවයෙන් ඉවත් කිරීම යනා දී පියවර ගෙන ඇත.කම්කරුවන් 4 (2%) දෙනෙකුගේ මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්ධයෙන් සේවා ස්ථානයේ නිලධාරීන් කිසිඳු ප්‍රතිචාරයක් දක්වා නොතිබිණ.

- ➢ කම්කරුවන් තම මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ විවිධ වූ නීතිවිරෝධී ක්‍රියාවන් සේවා ස්ථානයෙන් පිටතදී පමණක් නොව සේවා ස්ථානය තුළ දී ද සිදුකර ඇත. අනෙක් සේවකයන්ට පහරදීම, සොරකම් කිරීම, මත්ද්‍රව්‍ය අලෙවි කිරීම, දේපලවලට හානි කිරීම සහ මත්ද්‍රව්‍ය අලෙවියට සහයවීම යන වැරදි සේවා ස්ථානය තුළ සිදුකිරීම හඳුනාගත හැකිය. මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ අනෙක් සේවකයන්ට පහරදීම සහ සොරකම් කිරීම සෙසු වැරදි සිදුකිරීමට සාපේක්ෂව වැඩි බව නිගමනය කළ හැකිය.

- ➢ මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් කම්කරුවන් සේවා ස්ථානයෙහි දී විවිධ ගැටලුවලට මුහුණ දී ඇති බව නිගමනය කළ හැකිය. සෙසු සේවකයින් සමඟ ගැටුම් ඇති කරගැනීම, අඛණ්ඩව සේවයට වාර්තා කිරීමට නොහැකි වීම, සේවා කටයුතු නිසි පරිදි ඉටුකිරීමට නොහැකි වීම, සුළු අනතුරුවලට මුහුණ දීම, නිලධාරීන් සමඟ මත ගැටුම් ඇති කරගැනීම සහ සේවා ස්ථානයේ සෙසු සේවකයන් අතර තමා කොන් වීම යන ගැටලුවලටකම්කරුවන් තම මත්ද්‍රව්‍ය භාවිතය හේතුවෙන් සේවා ස්ථානයෙහි දී මුහුණ දී ඇත.

## 4. යෝජනා

- ✓ ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි සේවයෙහි නියුතු කම්කරුවන් ඉලක්ක කරගත් නිවාරණ වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදුකළ යුතුය. එහිදී මත්ද්‍රව්‍ය භාවිතයත් සමඟ ගොඩනැගිලි ඉදිකිරීමේ සේවා සථානයන්හි දී සිදුවිය හැකි අනතුරු පිළිබඳව සහ මුහුණ දීමට සිදුවිය හැකි ගැටලු පිළිබඳව ද ඔවුන් දැනුවත් කළ යුතුය.

- ✓ මත්ද්‍රව්‍ය භාවිත කරන්නා වූ කම්කරුවන් වෙනුවෙන් උපදේශන වැඩසටහන් දියත් කිරීම හා දිනපතා මත්ද්‍රව්‍ය භාවිතයට යොමු වී සිටින කම්කරුවන් එම ඇබ්බැහිකාරීත්වයෙන් මුදවා ගැනීම සඳහා ප්‍රතිකාරවලට යොමුකිරීමට කටයුතු කිරීම.

- ✓ සේවා ස්ථාන තුළ කම්කරුවන්ගේ මත්ද්‍රව්‍ය අලෙවි කිරීම සහ මත්ද්‍රව්‍ය භාවිත කිරීම වැළැක්වීම සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතනයන්හි සහයෝගය අවශ්‍ය අවස්ථාවන්හි දී ලබාගැනීමට අදාළව සහ වැඩබිම් තුළ මත්ද්‍රව්‍ය භාවිතය හා අලෙවිය නතර කිරීමට බලාත්මක කිරීම සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් ක්ෂෙත්‍රයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


Alberta Addiction and Mental Health Research Partnership Programme.(2010).Workplace Addiction and Mental Health in the construction idustry.

https://www.albertahealthservices.ca/assets/info/res/mhr/if-res-mhr-construction-industry-lit-review.pdf

Banwell C.,Dance P.,Quinn.C.,Davies.R & Hall D.,(2009).Alcohol,other drug use,and gambling among Australian Capital Territory (ACT) workers in building and related industries.

https://www.tandfonline.com/doi/abs/10.1080/09687630600577550

Gavioli A.,Mathias T A.,Rossi R M & Oliveira M L.,(2014).Risk related to drug use among male construction workers.

https://www.civilatwork.blogspot.com/2015/05/types-of-labour-employed-in.html